# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2026 මාර්තු මස 13 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

(2026.03.17 දින නිකුත් කරන ලදී)


# මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන)

**2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 375.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ දීර්ඝ නාමයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ වැරදිවල විෂය පථය තුළට සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද ඇතුළත් කිරීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා, ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කරනු ලැබේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ගනුදෙනුකරුවන් සමග සිදු කරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන් ආයතන විසින් අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් සහ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම අදාළ කර ගැනීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ යුතුකම්වලට අනුකූලව කටයුතු කිරීමට ආයතනයකට නොහැකි වන අවස්ථාවක දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය සඳහා විධිවිධාන සැලසීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනය විසින් ගනුදෙනුකරුවන් සමග සිදු කරන ගනුදෙනුවලට අදාළව වාර්තා පවත්වාගෙන යා යුතු කාලසීමාව සහ ආකාරය නිශ්චිතව දැක්වීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ගනුදෙනුකරුවන්ගේ වාර්තා යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා ආයතනවලට නියම කිරීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ නිශ්චිතව දක්වන ලද සීමාව ඉක්මවන්නා වූ ගනුදෙනු ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට විධිවිධාන සැලසීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ සැක කටයුතු ගනුදෙනු හෝ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම සඳහා ආයතනවලට නියම කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ත්‍රස්තවාදයට අදාළ දේපළ සම්බන්ධයෙන් වන තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත හෙළිදරව් කිරීම සඳහා ආයතනවලට නියම කිරීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ සැක සහිත ගනුදෙනු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගවලට අදාළ තොරතුරු හෙළිදරව් කිරීමෙන් තැනැත්තන් වැළැක්වීම වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද විමර්ශනය කිරීමේ දී සහ නඩු පැවරීමේ දී සැක සහිත ගනුදෙනු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට අවසර දීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ අධිකරණ නඩු කටයුතුවල දී තොරතුරු හෙළිදරව් කිරීම සඳහා අවසර දීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ගෙන ඇති නීත්‍යනුකූල ක්‍රියා සම්බන්ධයෙන් තැනැත්තන්ට නෛතික ආරක්ෂාව සැලසීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ වරප්‍රසාදලත් දැනුම් දීම් සඳහා නෛතික ආරක්ෂාව සැලසීම වේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ අනුකූලතා නිලධරයකු පත් කිරීම සඳහා ආයතනවලට නියම කිරීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට IIඅ වන අලුත් කොටස ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් කොටසේ නීතිය බලපෑම වනුයේ මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීම සහ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිශ්චිතව දැක්වීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මූල්‍ය බුද්ධි ඒකකයේ බලතල, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් විදේශීය ආයතන හා නියෝජ්‍යායතන සමග තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

***20 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ අන්තර් හුවමාරුව පදනම මත විදේශ නියාමන සහ අධීක්ෂණ අධිකාරීන් සමග තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය වෙත අවසර ලබා දීම වේ.

***21 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා, අදාළ වන යම් පරිශ්‍රයකට ඇතුළු වීමට සහ වාර්තා පරීක්ෂා කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධරයන්ට හැකියාව ලබා දීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මේ පනත යටතේ වන නියමයන්ට අනුකූලව කටයුතු කිරීම බලාත්මක කිරීම සඳහා පරිපාලන දණ්ඩන පැනවීම පිණිස විධිවිධාන සැලසීම වේ.

***23 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***24 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට IIIඅ වන අලුත් කොටස ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් කොටසේ නීතිය බලපෑම වනුයේ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ජාතික කමිටුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලසීම සහ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම වේ.

***25 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද ප්‍රධාන ප්‍රඥප්තියේ වැරදි පිළිබඳ විෂය පථය තුළට ඇතුළත් කිරීමට ආනුෂංගික වේ.

***26 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම පිණිස අධීක්ෂණ සහ නියාමන අධිකාරීන් විසින් ආයතන සම්බන්ධයෙන් නිරන්තර පරීක්ෂණ පැවැත්වීමට විධිවිධාන සැලසීම වේ.

***27 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කරනු ලැබේ.

***28 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ ඉංග්‍රීසි සහ සිංහල භාෂා පාඨවල ඇතැම් පරස්පරතා නිවැරදි කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***29 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ ඉංග්‍රීසි සහ සිංහල භාෂා පාඨවල ඇතැම් පරස්පරතා නිවැරදි කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***30 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ ඉංග්‍රීසි සහ සිංහල භාෂා පාඨවල ඇතැම් පරස්පරතා නිවැරදි කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***31 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, නිශ්චිතව දක්වන ලද වටිනාකම ඉක්මවන මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධනපත්‍ර සමග ශ්‍රී ලංකාවට පැමිණීම හෝ ශ්‍රී ලංකාවෙන් පිටව යාම සම්බන්ධයෙන් තැනැත්තකු මත පනවනු ලබන දණ්ඩනය ප්‍රතිශෝධනය කිරීමට ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ.

***32 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන වැරදි සඳහා අදාළ වන දණ්ඩන ප්‍රතිශෝධනය කිරීම වේ.

***33 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

***34 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් ව්‍යාපාරයක් මූල්‍ය ව්‍යාපාරයක් හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක් වශයෙන් නියම කිරීමට අමාත්‍යවරයාට හැකි කරවීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***35 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 29අ වන, 29ආ වන සහ 29ඇ වන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිවල නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ රීති, විධාන ආදිය සෑදීමට මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියාට හැකි කරවීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***36 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 30අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ විදේශීය බැංකුවල සහතික කරන ලද ප්‍රකාශවල ආවේශ්‍යතාව සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

***37 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ නියෝජ්‍යායතන, නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, අධීක්ෂණ අධිකාරීන් සහ ආයතන වෙත නියම කිරීමට විධිවිධාන සැලසීම වේ.

***38 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 31අ වන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයතනවල විදේශ ශාඛාවලට සහ පාලිත සමාගම්වලට ප්‍රධාන ප්‍රඥප්තිය අදාළ වීම සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

***39 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ ඇති ඇතැම් පද සම්බන්ධ අර්ථ නිරූපණ සංශෝධනය කිරීම සහ අලුත් පද සම්බන්ධ අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

එල්. ඩී. -ඕ. 40/2021

## 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක  දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දීර්ඝ නාමයේ "මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීම, අනාවරණය කිරීම, විමර්ශණය කිරීම සඳහා පහසුකම් සලසනු පිණිස හා පිළිවෙළින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට එරෙහි වැරදි සඳහා නඩු පැවරීමට අවශ්‍ය සැක කටයුතු මූල්‍ය ගණුදෙනු පිළිබඳ දත්ත එකතු කිරීම සඳහා; මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා නිසි උද්යෝගී පියවර ගැනීමට ඇතැම් ආයතනවලට නියම කිරීම සඳහා ද;" යන වචන වෙනුවට "මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වැරදි වළක්වාලීම, අනාවරණය කිරීම, විමර්ශනය කිරීම සහ ඒ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා පහසුකම් සැලසීම පිණිස සැක කටයුතු මුදල් ගනුදෙනු පිළිබඳ දත්ත එකතු කිරීම සඳහා ද; මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා නිසි උද්යෝගී පියවර ගැනීමට ඇතැම් ආයතනවලට නියම කිරීම සඳහා ද;" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2006 අංක 6 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන කොටසේ 2 වන වගන්තියට පෙරාතුව ම දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ I කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

**“ආයතනවල කාර්ය, අවදානම මත පදනම් වූ ප්‍රවේශය සහ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම”.**

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“අවදානම මත පදනම් වූ ප්‍රවේශය, ගනුදෙනු කරුවන් පිළිබඳ නිසි උද්යෝගය ආදිය.

**2.** (1) සෑම ආයතනයක් විසින් ම, මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද යම් රීතිවලට, විධානවලට සහ මාර්ගෝපදේශවලට යටත්ව, එහි මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ අවබෝධ කර ගැනීම කළ යුතු අතර, සම්පත් වෙන් කිරීම සහ ඒ අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(2) අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් අදාළ කර ගැනීමේ කාර්යය සඳහා ආයතනයක් විසින්-

(අ) ස්වකීය ගනුදෙනුකරුවන්, එම ගනුදෙනුකරුවන් ව්‍යාපාරවල නිරත වන රටවල් සහ කලාප, ඔවුන්ගේ නිෂ්පාදන, සේවා සහ බෙදාහැරීමේ මාර්ග ආශ්‍රිත මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් සම්බන්ධයෙන් තක්සේරුවක් සිදු කරනු ලැබිය යුතු ය;

(ආ) (අ) ඡේදයට අනුකූලව හඳුනා ගන්නා ලද මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල්

සැපයීම පිළිබඳ අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අනුමතය ඇතිව, මේ පනතේ නියමයන්ට සහ මේ පනත යටතේ හෝ එම ආයතනයට අදාළ වන වෙනත් යම් නීතියක් යටතේ නිකුත් කරන ලද නියෝගවලට, රීතිවලට, විධානවලට සහ මාර්ගෝපදේශවලට අනුව, අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි සහ පද්ධති නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) (අ) ඡේදයේ සඳහන් කරන ලද අවදානම් පිළිබඳ තක්සේරුවෙහි යාවත්කාලීන බව සහ ඒ අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගනු ලබන බව සහතික කරනු පිණිස එම අවදානම් පිළිබඳ තක්සේරුව කලින් කලට සමාලෝචනය කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයක් විසින්, යම් නිර්නාමික ගිණුමක් හෝ අංකයක් මගින් පමණක් හඳුන්වනු ලබන යම් ගිණුමක් හෝ ආයතනයේ දැනීම අනුව ව්‍යාජ හෝ අසත්‍ය නමකින් ක්‍රියාත්මක වන යම් ගිණුමක් ඇතුළුව, ඒ ගිණුම දරන්නා හඳුනාගත නොහැකි ගිණුමක් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(4) ආයතනයක් විසින්-

(අ) ගනුදෙනුකරුවකු සමග ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇති කර ගනු ලබන විට;

(ආ) තනි මෙහෙයුමකින් හෝ එකිනෙකට සම්බන්ධ බවට පෙනී යන මෙහෙයුම් වැඩි ගණනකින් සමන්විත ගනුදෙනුවක් ද ඇතුළත්ව, රීති මගින් නිශ්චිතව දක්වා ඇති නියමිත සීමාව ඉක්මවා වරින් වර සිදු වන ගනුදෙනුවක් සිදු කරන විට;

(ඇ) රීති මගින් නිශ්චිතව දක්වා ඇති නියමිත සීමාව ඉක්මවා විද්‍යුත් ප්‍රේෂණ වන්නා වූ වරින් වර සිදු වන ගනුදෙනුවක් සිදු කරන විට;

(ඈ) ප්‍රදානය කරනු ලැබ ඇති යම් නිදහස් කිරීමක් හෝ රීති මගින් නිශ්චිතව දක්වා ඇති යම් නියමිත සීමාවක් නොතකා, යම් ගනුදෙනුවකට අදාළව මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදක් හෝ යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය කරන ක්‍රියාවක් පිළිබඳව සාධාරණ සැකයක් ඇති විට; හෝ

(ඉ) දැනටමත් ලබාගෙන ඇති ගනුදෙනුකරු හඳුනා ගැනීමේ ලේඛනවල හෝ තොරතුරුවල සත්‍යතාව හෝ ප්‍රමාණවත් බව පිළිබඳ සැකයක් ඇති විට,

ඒ ආයතනය විසින්, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගය අනුගමනය කළ යුතු ය.

(5) ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගය අනුගමනය කිරීමේ කාර්යය සඳහා, මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද යම් රීතිවලට යටත්ව, ඒ ආයතනය විසින්-

(අ) එක් එක් ගනුදෙනුකරු ස්ථිර ගනුදෙනුකරුවෙක් ද නැතහොත් වරින්වර ගනුදෙනු සිදු කරන්නෙක් ද, හෝ ස්වාභාවික තැනැත්තකු ද නැතහොත් නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩපිළිවෙළක් ද යන්න හඳුනාගෙන යම් නිල ලේඛනයක් හෝ වෙනත් විශ්වසනීය මූලාශ්‍ර ලේඛනයක්, තොරතුරක් හෝ දත්ත පදනම් කර ගනිමින් ඒ ගනුදෙනුකරුගේ අනන්‍යතාව සත්‍යාපනය කර ගැනීම;

(ආ) ගනුදෙනුකරුවකු වෙනුවෙන් ක්‍රියා කිරීමට අදහස් කරන තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ ගනුදෙනුකරු විසින් ඒ තැනැත්තාට බලය දී ඇති බවට තහවුරු කරගෙන, ඒ තැනැත්තා හඳුනා ගැනීම සහ යම් නිල ලේඛනයක් හෝ වෙනත් විශ්වසනීය මූලාශ්‍ර ලේඛනයක්, තොරතුරක් හෝ දත්ත පදනම් කර ගනිමින්, ඒ තැනැත්තාගේ අනන්‍යතාව සත්‍යාපනය කර ගැනීම;

(ඇ) ගනුදෙනුකරුට අර්ථලාභී අයිතිකරුවකු සිටී නම් ඒ අර්ථලාභී අයිතිකරු හඳුනාගෙන, ගනුදෙනුකරුගේ ඒ අර්ථලාභී අයිතිකරු පිළිබඳව සෑහීමට පත්වීම සඳහා, යම් නිල ලේඛනයක් හෝ වෙනත් විශ්වසනීය මූලාශ්‍ර ලේඛනයක්, තොරතුරක් හෝ දත්ත පදනම් කර ගනිමින්, ඒ අර්ථලාභී අයිතිකරුගේ අනන්‍යතාව සත්‍යාපනය කර ගැනීම සඳහා සාධාරණ පියවර ගැනීම; සහ

(ඈ) ගනුදෙනුකරුවකු සමග වන අපේක්ෂිත ව්‍යාපාරික සම්බන්ධතාවයෙහි ස්වභාවය සහ අරමුණ අවබෝධ කර ගැනීම සහ උචිත පරිදි වෙනත් යම් අදාළ ලේඛනයක්,

ද්‍රව්‍යයක් හෝ දත්ත භාවිත කර ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීම,

සිදු කරනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද යම් රීතිවලට යටත්ව, ආයතනයක් විසින් -

(අ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් ඉහළ මට්ටමක ඇති බවට තක්සේරු කෙරෙන අවස්ථාවක දී ගනුදෙනුකරුවන් පිළිබඳ ප්‍රවර්ධිත නිසි උද්යෝගය අනුගමනය කළ යුතු ය;

(ආ) මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම පිළිබඳ අවදානම් අඩු මට්ටමක ඇති බවට තක්සේරු කෙරෙන අවස්ථාවක දී, ගනුදෙනුකරුවන් පිළිබඳ සරල කරන ලද නිසි උද්යෝගය අනුගමනය කළ හැකි ය; සහ

(ඇ) සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් කළමනාකරණය සහ අවම කිරීම සඳහා ගෙන ඇති පියවර, තක්සේරු කරන ලද අවදානම් මට්ටමට අනුපාතික වන බවට වගබලා ගත යුතු ය.

(7) ආයතනයක් විසින් මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන යම් රීතිවලට යටත්ව, (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේදවල නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත තත්ත්වයන් අතුරෙන් කවර හෝ තත්ත්වයක දී, (5) වන උපවගන්තියේ

(අ) ඡේදයේ සිට (ඇ) ඡේදය දක්වා වූ ඡේද යටතේ ලබාගත් යම් තොරතුරක් වෙනත් ආයතනයක් සමග හුවමාරු කරගනු ලැබිය හැකි ය.

(8) (4) වන උපවගන්තියේ කාර්යය සඳහා, මුදල් හෝ විද්‍යුත් අරමුදල් පැවරීමකට අදාළව, "වරින්වර සිදුවන ගනුදෙනුව" යන්නෙන්, යම් තැනැත්තකු විසින් නිතිපතා පදනමකින් සිදු කරනු නොලබන, එක් වරක් පමණක් හෝ කලින් කලට සිදු කරනු ලබන යම් ගනුදෙනුවක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයට අදාළ බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීමට නොහැකි නම් කාර්යපටිපාටිය.

**3.** (1) 2 වන හෝ 5 වන වගන්තියේ දක්වා ඇති පරිදි ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීමට යම් ආයතනයකට නොහැකි වන්නේ නම්, ඒ ආයතනය විසින් -

(අ) ගිණුම විවෘත කිරීම හෝ ගනුදෙනුකරු සමග ව්‍යාපාරික සම්බන්ධතාව ආරම්භ කිරීම හෝ ගනුදෙනුව සිදු කිරීම නොකළ යුතු ය; හෝ

(ආ) ගනුදෙනුකරු සමඟ ව්‍යාපාරික සම්බන්ධතාව අවසන් කළ යුතු ය.

(2) ඒ ආයතනය විසින් ඒ ගනුදෙනුකරුට අදාළව 7 වන වගන්තිය යටතේ සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව සලකා බලනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදක් සිදු කිරීම හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම පිළිබඳව ඒ ආයතනය විසින් සැක කරනු ලබන හෝ එසේ සැක කිරීමට ඒ ආයතනයට සාධාරණ හේතු ඇති අවස්ථාවක ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගය අනුගමනය කිරීම මගින් ගනුදෙනුකරු වෙත හෝඩුවාවක් සැපයෙනු ඇති බව විශ්වාස කිරීමට හේතු ඇත්නම්, ඒ ආයතනය විසින් ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගය අනුගමනය නොකළ යුතු අතර, 7 වන වගන්තිය යටතේ සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් පහත සඳහන් වාර්තා ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වඩා දීර්ඝ වූ කාලසීමාවක් තෙක් තබාගත යුතු බවට විධාන නිකුත් කර ඇත්නම් මිස, සෑම ආයතනයක් විසින් ම-

(අ) සියලු ම දේශීය හා ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ වාර්තා සහ සියලු ම ගනුදෙනුවලට අදාළ ලිපිගනුදෙනු පිළිබඳ වාර්තා සහ මූල්‍ය බුද්ධි ඒකකයට ඉදිරිපත් කරන ලද සියලු වාර්තා පිළිබඳ සටහන්, අවස්ථාවෝචිත පරිදි, ගනුදෙනුව, ලිපිගනුදෙනුව හෝ වාර්තාව ඉදිරිපත් කිරීම සම්පූර්ණ කරන ලද දින සිට වසර හයක කාලයක් පවත්වාගෙන යාම; සහ

(ආ) සිදු කරන ලද විශ්ලේෂණයක ප්‍රතිඵල, අවදානම් තක්සේරු කිරීම් සහ

ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පිළිබඳ ලිපිගොනු සහ ව්‍යාපාරික ලිපි ගනුදෙනු ඇතුළුව, 2 වන වගන්තිය ප්‍රකාරව ගනුදෙනුකරු පිළිබඳව නිසි උද්යෝගයේ කොටසක් ලෙස ලබාගත් හෝ සකස් කරන ලද වාර්තා, අවස්ථාවෝචිත පරිදි, ගිණුම වැසූ දින සිට හෝ ව්‍යාපාරික සම්බන්ධතාව නතර කරන ලද දින සිට හෝ එවැනි සම්බන්ධතාවක් නොමැති විට, වරින් වර සිදුවන ගනුදෙනුව සිදු කළ දින සිට වසර හයක කාලයක් පවත්වාගෙන යාම,

කළ යුතු අතර, එසේ වඩා දීර්ඝ වූ කාලසීමාවක් තෙක් තබාගත යුතු බවට විධාන නිකුත් කර ඇති විටෙක, ඒ වාර්තා ඒ කාලසීමාව තෙක් තබාගත යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ "මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරනු ලබන රීතිවල සඳහන්" යන වචන වෙනුවට "මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන රීති මගින් නිශ්චිතව සඳහන්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) මේ පනත යටතේ යම් වාර්තාවක් පවත්වාගෙන යා යුතු යයි නියම කරනු ලබන අවස්ථාවක-

(අ) මූල්‍ය බුද්ධි ඒකකයෙන් හෝ නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකින් තොරතුරු ලබාගැනීම සඳහා ලැබෙන ඉල්ලීම් කඩිනමින් ඉටු කිරීමට හැකිවන ආකාරයකින් හා ආකෘතියකින් එය පවත්වාගෙන යනු ලැබිය යුතු ය;

(ආ) එහි පිටපතක් -

(i) ඉන් කඩදාසි පිටපතක් පහසුවෙන් ගත හැකි නම්, යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි ආකෘතියකින්;

(ii) ඉන් කඩදාසි පිටපතක් පහසුවෙන් ගත හැකි නම් හා වාර්තාව තබා ගන්නා තැනැත්තාගේ විද්‍යුත් අත්සනක් සත්‍යාපන කාර්යය සඳහා තබා ගන්නේ නම්, විද්‍යුත් ආකෘතියකින්; හෝ

(iii) ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය පටිගත කිරීමක ආකෘතියකින්,

තබා ගනු ලැබිය හැකි ය; සහ

(ඇ) අවශ්‍ය අවස්ථාවල දී, අපරාධ නඩු කටයුත්තක සාක්ෂි ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා තනි තනිව ගනුදෙනු නැවත සකස් කිරීමට හැකි වන ආකාරයකින් සහ ආකෘතියකින් එය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ, “නිරීක්ෂණය කරනු ලැබිය යුතු ය.” යන වචන වෙනුවට “නිරීක්ෂණය කරනු ලැබිය යුතු ය; සහ” යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

“(ඇ) ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගය හා සම්බන්ධ ක්‍රියාවලිය තුළින් රැස් කරන

ලද ලේඛන, තොරතුරු හෝ දත්ත, දැනට පවතින වාර්තා සමාලෝචනය කිරීමෙන් යාවත්කාලීනව සහ අදාළ වන පරිදි පවත්වා ගෙන යනු ලබන බවට වගබලා ගත යුතු ය.”; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

“නොකඩවා ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සහ ගනුදෙනු සුපරීක්ෂාව.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“ආයතන විසින් මුදල් ගනුදෙනු වාර්තා කළ යුතු බව.

**6.** (1) ආයතනයක් විසින් -

(අ) ලබන්නා සහ යවන්නා යන දෙදෙනා ම මහ බැංකුව විසින් බලපත්‍ර දී ඇති බැංකු වන්නේ නම් මිස, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු යම් මුදලක් හෝ යම් විදේශ ව්‍යවහාර මුදලකින් වූ ඊට සමාන මුදලක් ඉක්මවන, මුදලින් සිදුවන යම් ගනුදෙනුවක්; සහ

(ආ) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු යම් මුදලක් හෝ යම් විදේශ ව්‍යවහාර මුදලකින් වූ ඊට සමාන මුදලක් ඉක්මවන, ගනුදෙනුකරුවකුගේ යම් විද්‍යුත් මුදල් පැවරීමක්,

මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් විධාන කරනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් සහ කාලසීමාවක් තුළ, මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා විවිධ ආයතන කාණ්ඩ සම්බන්ධයෙන් විවිධ නියමිත සීමාවන් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම**

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(1) (අ) යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක්, යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් හෝ වෙනත් යම් සාපරාධී වරදක් සිදු කිරීමකට අදාළ විය හැකි යයි ආයතනයක් විසින් සැක කරනු ලබන හෝ එසේ සැක කිරීමට ආයතනයකට සාධාරණ හේතු ඇති අවස්ථාවක; හෝ

(ආ) (i) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන යටතේ වන වරදකට සූදානම් වීමේ ක්‍රියාවකට;

(ii) නීති විරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් සම්බන්ධයෙන් තැනැත්තකු හෝ තැනැත්තන් පිළිබඳ විමර්ශනය කිරීමකට හෝ නඩු පැවරීමකට හෝ 2006 අංක 5 දරන මුදල්

විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත බලාත්මක කිරීමෙහිලා අන්‍යාකාරයෙන් සහාය වීමකට; හෝ

(iii) සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද සංස්ථාපනය කරනු ලබන යම් ක්‍රියාවක් සිදු කිරීමට,

අදාළ විය හැකි යයි සැක කරන තොරතුරු ආයතනයකට ඇති අවස්ථාවක හෝ ඒ බව විශ්වාස කිරීමට ආයතනයකට සාධාරණ හේතු ඇති අවස්ථාවක,

එම ආයතනය විසින්, එම සැකය ඇතිවීමෙන් හෝ එම තොරතුරු ලැබීමෙන් පසුව, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එහෙත්, එතැන් පටන් වැඩ කරන දින දෙකක් ගත වීමට පෙරාතුව, එම ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීම හෝ එම තොරතුර පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) ලියවිල්ලකින් හෝ විද්‍යුත් ක්‍රමයකින් හෝ පැය විසිහතරක් ඇතුළත ලියවිල්ලකින් දැනුම් දිය යුතු දුරකථන ඇමතුමක් මගින් හෝ තත්කාර්යය සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන විධාන මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් ආකාරයකින් විය යුතු ය;";

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන විධාන මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකින් සහ විස්තරවලින් සමන්විත විය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"මූල්‍ය බුද්ධි ඒකකය වෙත තොරතුරු හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් ආයතන සතු යුතුකම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ "තත් කාලයේ" යන වචනවල සිට "ලැබුණු දේපළක්" යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට "ත්‍රස්තවාදයට අදාළ දේපළක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) නම් කරන ලද පුද්ගලයකු හෝ නම් කරන ලද අස්ථිත්වයක් විසින් හෝ නම් කරන ලද පුද්ගලයකු හෝ නම් කරන ලද අස්ථිත්වයක් වෙනුවෙන් අයිතිය, සන්තකය හෝ පාලනය දරන හෝ, නම් කරන ලද පුද්ගලයකු හෝ නම් කරන ලද අස්ථිත්වයක් විසින් හෝ නම් කරන ලද පුද්ගලයකු හෝ නම් කරන ලද අස්ථිත්වයක් වෙනුවෙන් අයිතිය, සන්තකය හෝ පාලනය දරන බව සැක කිරීමට සාධාරණ හේතු ඇති, ත්‍රස්තවාදයට අදාළ දේපළක් ඒ තැනැත්තාගේ අයිතියේ, සන්තකයේ හෝ පාලනයේ පැවතීම;" ;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "තත් කාලයෙහි" යන වචනවල සිට "ගනුදෙනුවක්" යන වචනය දක්වා ඇති සියලු වචන වෙනුවට, "ත්‍රස්තවාදයට අදාළ දේපළක් පිළිබඳ ගනුදෙනුවක් හෝ යෝජිත ගනුදෙනුවක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (ඈ) ඡේදයේ "තත් කාලයෙහි" යන වචනවල සිට "සම්බන්ධ වී" යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට "යම් ගනුදෙනුවකට හෝ යෝජිත ගනුදෙනුවකට ත්‍රස්තවාදයට අදාළ දේපළක් සම්බන්ධ වී" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) මේ වගන්තියේ කාර්ය සඳහා "ත්‍රස්තවාදයට අදාළ දේපළ" යන්නෙන්-

(අ) ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමෙන් උත්පාදිත දේ;

(ආ) ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමට භාවිත කරනු ලැබ ඇති හෝ භාවිත කරමින් සිටින හෝ භාවිත කිරීමට ඉඩ ඇති දේපළක් හෝ ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු කිරීමට ආනුෂංගික දේපළක්;

(ඇ) ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් භාවිත කරනු ලැබ ඇති හෝ භාවිත කරමින් සිටින හෝ භාවිත කිරීමට ඉඩ ඇති දේපළක්;

(ඈ) ත්‍රස්තවාදී කණ්ඩායමකට අයත් හෝ ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් පාලනය කරනු ලබන හෝ ත්‍රස්තවාදී කණ්ඩායමක් වෙනුවෙන් අයිතිය දරන හෝ ත්‍රස්තවාදී කණ්ඩායමක් වෙනුවෙන් පාලනය කරනු ලබන දේපළක්; හෝ

(ඉ) ත්‍රස්තවාදී ක්‍රියාවකට අරමුදල් සැපයීම පිණිස ත්‍රස්තවාදී කණ්ඩායමකට සහාය දැක්වීමේ කාර්යය සඳහා එකතු කරනු ලැබ ඇති දේපළක්,

අදහස් වේ."; සහ

(4) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"ත්‍රස්තවාදයට අදාළ දේපළ හා සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීමේ යුතුකම.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) "වෙනත් යම් තැනැත්තකුට හෙළි කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට, "වෙනත් යම් තැනැත්තකුට ඍජුව හෝ වක්‍රව හෙළිදරව් කරනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) යම් තොරතුරක් හෙළිදරව් කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින්, සැකයක් ඇති කරගෙන ඇති බවට හෝ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති බවට හෝ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි බවට නිගමනය කරනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වෙනත් යම් තොරතුරක්,"; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) මේ පනත යටතේ වාර්තාවක් ඉදිරිපත් කරන තැනැත්තාගේ නිලධරයකුට

හෝ සේවානියුක්තයකුට හෝ අනුයෝජිතයකුට, ඒ තැනැත්තාගේ කාර්ය ඉටු කිරීම හා සම්බන්ධ වූ යම් කාර්යයක් සඳහා;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "යම් තොරතුරක් එළිදරව් කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට, "යම් තොරතුරක් සෘජුව හෝ වක්‍රව හෙළිදරව් කරනු නො ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (i) වන ඡේදයේ "නඩු පැවරීමේ; නැතහොත්" යන වචන වෙනුවට "නඩු පැවරීමේ;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපවගන්තියේ (ii) වන ඡේදයේ "ක්‍රියාත්මක කිරීමේ," යන වචන වෙනුවට, "ක්‍රියාත්මක කිරීමේ; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපවගන්තියේ (ii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(iii) සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද සංස්ථාපනය කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් තැනැත්තකු විමර්ශනය කිරීමේ හෝ ඔහුට විරුද්ධව නඩු පැවරීමේ,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“අධිකරණ කටයුතුවල දී හෙළිදරව් කිරීම වළක්වනු නො ලැබිය යුතු බව.

**11.** මේ පනතේ විධිවිධානවලට සහ තොරතුරු හෙළිදරව් කිරීම තහනම් කෙරෙන තත් කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, 9 වන හෝ 10 වන වගන්තියේ ඇතුළත් කිසිවකින්, අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතු සම්බන්ධයෙන් හෝ නඩු කටයුතුවල දී, යම් තොරතුරක් හෙළිදරව් කිරීම වලක්වනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය අදාළ වන යම් තොරතුරක් හෙළිදරව් කිරීම යුක්තිය පසිඳලීමෙහිලා අවශ්‍ය යයි විනිශ්චයකාරවරයා හෝ මුලසුන දරන නිලධරයා සෑහීමට පත්වන්නේ නම් මිස, තැනැත්තකු විසින් ඒ තොරතුර යම් අධිකරණ කටයුත්තක දී හෙළිදරව් නොකළ යුතු ය.”.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(1) මේ පනත ප්‍රකාරව සද්භාවයෙන් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගවලට හෝ මේ පනත ප්‍රකාරව මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද රීතිවලට හෝ විධානවලට අනුකූලව, ආයතනයක් විසින් හෝ ඒ ආයතනයේ සුදුසුකම්ලත් විගණකවරයකු විසින් හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් හෝ සුදුසුකම්ලත් විගණකවරයකුගේ හෝ අධීක්ෂණ අධිකාරියක අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, නිලධරයකු, සේවානියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් සිදු කරන ලද යම් ක්‍රියාවකට අදාළව-

(අ) ඒ ආයතනයට හෝ ඒ ආයතනයේ සුදුසුකම්ලත් විගණකවරයාට හෝ අධීක්ෂණ අධිකාරියට විරුද්ධව; හෝ

(ආ) ඒ ආයතනය තුළ ස්වකීය සේවානියුක්තියේ හෝ ඒ ආයතනයේ අනුයෝජිතයකු ලෙස කටයුතු කරන අතරතුර හෝ ඒ ආයතනය, සුදුසුකම්ලත් විගණකවරයා හෝ අධීක්ෂණ අධිකාරිය වෙනුවෙන් ක්‍රියා කරනු ලබන අධ්‍යක්ෂවරයකුට, හවුල්කරුවකුට, නිලධරයකුට, සේවානියුක්තයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව,

සිවිල් නඩු කටයුතු, අපරාධ නඩු කටයුතු හෝ විනයානුකූල ක්‍රියාමාර්ග ගනු නොලැබිය යුතු ය.'';

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''මේ පනතේ 8 වන වගන්තිය'' යන වචන සහ ඉලක්කම වෙනුවට, ''මේ පනතේ 28 වන වගන්තිය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(3) යම් ආයතනයක්, සුදුසුකම්ලත් විගණකවරයකු හෝ අධීක්ෂණ අධිකාරියක් හෝ ඒ ආයතනයේ සුදුසුකම්ලත් විගණකවරයාගේ හෝ අධීක්ෂණ අධිකාරියේ යම් අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, නිලධරයකු, සේවානියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ වාර්තාවක් ඉදිරිපත් කරන්නේ නම්, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදකට නඩු පැවරීමේ කාර්ය සඳහා ඒ ආයතනය, සුදුසුකම්ලත් විගණකවරයා, අධීක්ෂණ අධිකාරිය, අධ්‍යක්ෂවරයා, හවුල්කරු, නිලධරයා, සේවානියුක්තයා හෝ අනුයෝජිතයා සන්තකයේ ඒ තොරතුරු කවර හෝ විටෙක දී නොතිබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.''.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් වරප්‍රසාදලත් දැනුම්දීමක් හෙළිදරව් කිරීම සඳහා අධි නීතිඥවරයකුට" යන වචන වෙනුවට "යම් වරප්‍රසාදලත් දැනුම්දීමක් හෙළිදරව් කිරීම සඳහා නීතිඥවරයකුට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) (i) ස්වකීය වෘත්තීමය තත්ත්වයෙන් නීතිඥවරයකු හෝ නීති උපදේශකවරයකු සහ ස්වකීය වෘත්තීමය තත්ත්වයෙන් වෙනත් බැරිස්ටර්වරයකු, සොලිස්ටර්වරයකු, නීතිඥවරයකු, ඇටෝර්නිවරයකු හෝ නීති උපදේශකවරයකු අතර; හෝ

(ii) සෘජුව හෝ ඒ කවරෙකුගේ හෝ අනුයෝජිතයකු හරහා වක්‍රව, ස්වකීය වෘත්තීමය තත්ත්වයෙන්, නීතිඥවරයකු හෝ නීති උපදේශකවරයකු සහ සේවාදායකයා අතර,

හුවමාරු වන වාචික හෝ ලියවිල්ලකින් වූ, රහස්‍ය දැනුම්දීමක්;"; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) එය, යම් නීත්‍යානුකූල නොවන හෝ නීති විරෝධී ක්‍රියාකාරකමක් කිරීමේ හෝ තවදුරටත් කරගෙන යාමේ කාර්යය සඳහා කරනු නොලැබී නම් හෝ සිදු කරනු නොලැබී නම්,"; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "(අධි නීතිඥවරයකු, ඔහුගේ හෝ ඇයගේ සේවාදායකයා හෝ වෙනත් යම් තැනැත්තකු)" යන වචන වෙනුවට "(නීතිඥවරයකුගේ, සේවාදායකයාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ)" යන වචන සහ "අධි නීතිඥවරයාගේ භාර ගිණුම" යන වචන වෙනුවට "නීතිඥවරයාගේ භාර ගිණුම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අනුකූලතා නිලධරයකු පත් කිරීම සහ අනුකූලතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් ආයතනයේ කාර්ය සහ කර්තව්‍ය.

**14.** සෑම ආයතනයක් විසින් ම -

(අ) ඒ ආයතනය විසින් මේ පනතේ නියමවලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීම සඳහා වගකිව යුතු අනුකූලතා නිලධරයා ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය;

(ආ) අනුකූලතා නිලධරයාට සහාය දැක්වීමට අවශ්‍ය විය හැකි පරිදි වෙනත් නිලධරයන් පත් කරනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ ආයතනයේ කාර්ය, කර්තව්‍ය සහ බැඳීම් නිසි පරිදි ඉටු කරනු ලබන බවට සහ සිදු කරනු ලබන බවට වගබලා ගැනීම සඳහා ප්‍රමාණවත් වෙනත් සම්පත් සපයනු ලැබිය යුතු ය;

(ඇ) (i) අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් අදාළ කර ගනිමින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් හඳුනා ගැනීම, අවබෝධ කර ගැනීම සහ තක්සේරු කිරීම සහ එම අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සහ කාර්යපාටිපාටි සකස් කිරීම;

(ii) ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමට එරෙහිව ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාත්මක කිරීම;

(iii) 2 වන වගන්තිය යටතේ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීම පිළිබඳ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම;

(iv) 4 වන වගන්තිය යටතේ වාර්තා තැබීමේ සහ පවත්වාගෙන යාමේ අවශ්‍යතා සඳහා කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම;

(v) 5 වන වගන්තිය යටතේ අඛණ්ඩව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගය සහ ගනුදෙනු පිළිබඳ සුපරීක්ෂාව පිළිබඳ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම;

(vi) 6 වන, 7 වන, 8 වන හා 22 වන වගන්ති යටතේ වාර්තා කිරීමේ අවශ්‍යතා පිළිබඳ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම;

(vii) අදාළ වන අවස්ථාවල දී, 15 වන වගන්තිය සහ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක්, රීතියක් හෝ විධානයක් සමග අනුකූලව කටයුතු කිරීමට වගබලා ගැනීම;

(viii) මේ පනත සහ ඒ යටතේ සාදන ලද නැතහොත් නිකුත් කරන ලද නියෝග, රීති, විධාන, චක්‍රලේඛ හා මාර්ගෝපදේශ මගින් සහ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් තත්කාලයෙහි බල පවත්නා වෙනත් යම් නීතියක් මගින් නියම කරන ලද පරිදි ආයතනය විසින් අනුගමනය කරනු ලබන පියවර, ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි පිළිබඳව එහි නිලධරයන්, සේවානියුක්තයන් සහ අනුයෝජිතයන් දැනුම්වත් කිරීම;

(ix) සේවානියුක්තයන් හෝ අනුයෝජිතයන් වශයෙන් සේවයට ගැනීමට පෙර සියලුම තැනැත්තන් පිරික්සීම; සහ

(x) මේ පනත මගින් හා ඒ යටතේ සාදන ලද නැතහොත් නිකුත් කරන ලද නියෝග, රීති, විධාන සහ මාර්ගෝපදේශ මගින් ආයතන මත පනවන ලද වෙනත් පියවර සමග අනුකූලව කටයුතු කරනු ලබන බවට වගබලා ගැනීම,

සඳහා කාර්යපටිපාටි හා පද්ධති ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය;

(ඇ) ස්වකීය කාර්යපටිපාටි හා පද්ධති මේ පනතේ විධිවිධානවලට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කර බැලීම සඳහා විගණන කර්තව්‍යයක් ස්ථාපිත කළ යුතු ය; සහ

(ඉ) සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම සඳහා ස්වකීය නිලධරයන්, සේවානියුක්තයන් හා අනුයෝජිතයන් පුහුණු කළ යුතු ය.''.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ කොටස ඒ ප්‍රඥප්තියේ IIඅ වන කොටස ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියට IIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම

**''IIඅ වන කොටස**

**මූල්‍ය බුද්ධි ඒකකය**

මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවීම.

**14අ.** (1) මේ පනතේ කාර්ය සඳහා (මේ පනතේ ''මූල්‍ය බුද්ධි ඒකකය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු මූල්‍ය බුද්ධි ඒකකයක් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පිහිටුවනු ලැබිය යුතු ය.

(2) 2006 මාර්තු මස 23 වන දින අංක 1437/24 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබ ඇති සහ මේ වගන්තිය ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ක්‍රියාත්මකව පවත්නා මූල්‍ය බුද්ධි ඒකකය සියලු කාර්ය සඳහා (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(3) මූල්‍ය බුද්ධි ඒකකය, මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ක්‍රියාකාරීත්වයෙන් ස්වාධීන සහ ස්වායත්ත ඒකකයක් විය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්යය සඳහා, “ක්‍රියාකාරීත්වයෙන් ස්වාධීන සහ ස්වායත්ත” යන්නෙන් -

(අ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය නිදහසේ ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට සහ මේ පනත යටතේ මූල්‍ය බුද්ධිය හා සම්බන්ධ නිශ්චිත තොරතුරු විශ්ලේෂණය කිරීම, ඉල්ලා සිටීම, ඉදිරිපත් කිරීම හෝ ප්‍රචාරය කිරීම සඳහා ස්වායත්ත තීරණ ගැනීමට අධිකාරි බලය හා හැකියාව තිබීම;

(ආ) වෙනත් දේශීය නිසි බලධරයන් සමග හෝ විදේශීය සමස්ථානිකයන් සමග තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් ස්වාධීනව වැඩපිළිවෙළ සකස් කර ගැනීමට හෝ ඒ කටයුතුවල නිරත වීමට හැකියාව තිබීම;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ හර කර්තව්‍යවලින් වෙන් වූ නිශ්චිත හර කර්තව්‍ය පැවතීම; සහ

(ඈ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ සිට (ඇ) ඡේදය දක්වා වූ ඡේදවල නිශ්චිතව දක්වා ඇති පරිදි ස්වකීය මෙහෙයුම් ස්වාධීනත්වය කැප කිරීමට සිදු විය හැකි යම් අනිසි බලපෑමකින් හෝ මැදිහත් වීමකින් තොරව, තනි හෝ චර්යාරටානුගත පදනමක් මත ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය සම්පත් ලබා ගැනීමට සහ යෙදවීමට හැකියාව තිබීම,

අදහස් වේ.

මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා සහ කාර්ය මණ්ඩලය.

**14ආ.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් මහ බැංකුවේ IV වන ශ්‍රේණියේ හෝ ඊට ඉහළ මට්ටමේ මාණ්ඩලික නිලධරයකු විය යුතු නිලධරයකු මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, ‘‘මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා’’ යන යෙදුමට මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියාගේ තත්ත්වයෙහි කටයුතු කරන නිලධරයකු ඇතුළත් විය යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ සේවය කිරීමට පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන මහ බැංකුවේ නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්ය මණ්ඩලය ලෙස සලකනු ලැබිය යුතු ය.

මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**14ඇ.** (1) මේ පනත මගින් හෝ මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත පිරිනමනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති හෝ පවරනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් පමණක් ක්‍රියාත්මක කළ යුතු වන පහත සඳහන් බලතල හැර, මේ පනත මගින් හෝ මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා වෙත පිරිනමනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ලිඛිතව නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි නියමවලට සහ කොන්දේසිවලට යටත්ව, මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්ය මණ්ඩලයේ යම් නිලධරයකු වෙත පැවරීම මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් සිදු කරනු ලැබිය හැකි ය:-

(අ) ආයතනවලට අදාළ වන හෝ මේ පනත මගින් නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සෑදීම;

(ආ) සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් මත පදනම්ව ගනුදෙනුවක් හෝ ගිණුමක් අත්හිටුවීම; සහ

(ඇ) 19 වන වගන්තිය යටතේ පරිපාලනමය දණ්ඩන පැනවීම.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබ ඇති නිලධරයකු විසින් ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් ඒ නිලධරයා වෙත කලින් කල ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි විධානවලට හෝ කොන්දේසිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබ ඇති නිලධරයකුට මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය පැවරීම අවලංගු කරන තෙක් එසේ පවරන ලද බලයට, කාර්යයට

හෝ කර්තව්‍යයට ආනුෂංගික සියලු ක්‍රියා සහ දේවල් සිදු කිරීමට බලය තිබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ වූ ඒ පැවරීම නොතකා, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් එසේ පවරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා සහ කාර්ය මණ්ඩලය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**14ඈ.** මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් නඩු පැවරීමේ කාර්යය සඳහා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා සහ කාර්ය මණ්ඩලය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "යම් තොරතුරක් එකතු කිරීම හෝ ආයතනයක අධිකරණ අධිකාරියට නියම කිරීම් කරනු ලැබිය යුතු ය;" යන වචන වෙනුවට "යම් තොරතුරක් ලබා ගැනීම හෝ ලබා ගන්නා ලෙසට ආයතනයක අධීක්ෂණ අධිකාරියට නියම කිරීම කරනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකින් හා අධීක්ෂණ නියෝජ්‍යායතනයකින්" යන වචන වෙනුවට "නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයකින්, අධීක්ෂණ අධිකාරියකින් හෝ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් අදාළ යයි සලකනු ලැබිය හැකි යම් තැනැත්තකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඅ) මෙහෙයුම් හා උපාය මාර්ගික විශ්ලේෂණ සිදු කරනු ලැබිය යුතු ය;";

(ඈ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "යා යුතු ය;" යන වචන වෙනුවට "යා යුතු අතර, ඒ පරීක්ෂණවලින් හෙළිදරව් වන කරුණු ඒ ආයතනයේ අධීක්ෂණ, නියාමන, බලපත්‍ර ලබා දීමේ හෝ ලියාපදිංචි කිරීමේ අධිකාරිය සමග හුවමාරු කර ගනු ලැබිය හැකි ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඉඅ) 23 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් ආයතන පිළිබඳව අවදානම මත පදනම් වූ අධීක්ෂණය සිදු කරනු ලැබිය හැකි ය;";

(ඊ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඊඅ) ඊට ලැබෙන යම් වාර්තාවකින් හෝ තොරතුරකින් අනාවරණය වන යම් කරුණක් හෝ තොරතුරක් උචිත අධීක්ෂණ අධිකාරිය වෙත හෝ ස්වයං නියාමන අධිකාරිය වෙත යොමු කරනු ලැබිය හැකි ය;

(ඊආ) ඊට ලැබෙන හෝ එය සන්තකයේ ඇති යම් වාර්තාවකින් හෝ තොරතුරකින් අනාවරණය වන තොරතුරු හෝ මූල්‍ය බුද්ධි තොරතුරු නැතහොත් ඒ දෙකම, ඉල්ලීමක් මත, මුදල් විශුද්ධිකරණය,

ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම හෝ යම් ආශ්‍රිත නීති විරෝධී ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන යම් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් වෙත සපයනු ලැබිය හැකි ය;'';

(උ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ ''තවදුරටත් වූ ක්‍රියාකාරකමක්'' සහ ''විනාශ කරනු ලැබිය යුතු ය;'' යන වචන වෙනුවට පිළිවෙලින් ''තවදුරටත් වූ සැක කටයුතු ක්‍රියාකාරකමක්'' සහ ''විනාශ කරනු ලැබිය හැකි ය;'' යන වචන ආදේශ කිරීමෙන්;

(ඌ) ඒ වගන්තියේ (ඌ) ඡේදයේ ''යම් පියවර ගත යුතු යම් ආයතනයක අධීක්ෂණ අධිකාරියට උපදෙස් දෙනු ලැබිය යුතු ය; නැතහොත්, නියම කරනු ලැබිය යුතු ය;'' යන වචන වෙනුවට ''යම් පියවර ගැනීමට ආයතනයකට උපදෙස් දීම හෝ ආයතනයක අධීක්ෂණ අධිකාරියට නියම කිරීම කළ හැකි ය;'' යන වචන ආදේශ කිරීමෙන්;

(එ) ඒ උපවගන්තියේ (ඒ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

''(ඒ) 29අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රීතිවලට සහ 29ආ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානවලට, චක්‍රලේඛවලට හෝ මාර්ගෝපදේශවලට යටත්ව, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම, වාර්තා තැබීම, වාර්තා කිරීම පිළිබඳ බැඳීම්, සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම, ගනුදෙනු අත්හිටුවීම, අවදානම මත පදනම් වූ ප්‍රවේශය සහ

එවැනි වෙනත් කාරණා සම්බන්ධයෙන් විධාන, චක්‍රලේඛ හෝ මාර්ගෝපදේශ නිකුත් කිරීමට පහසුකම් සැලසීම හෝ ආයතනයක අධීක්ෂණ අධිකාරිය මගින් එසේ නිකුත් කිරීමට කටයුතු සැලැස්වීම කළ හැකි ය;";

(ඒ) ඒ උපවගන්තියේ (ක) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(කඅ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම අනාවරණය කිරීම හා වළක්වාලීම පිළිබඳව සහ මූල්‍ය කාර්යසාධක බලකාය විසින් නිර්දේශ කරනු ලබන වෙනත් ක්ෂේත්‍ර පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්ය මණ්ඩලයේ දැනුම සහ නිපුණතා වර්ධනය කිරීමට අවශ්‍ය විය හැකි පුහුණු වැඩසටහන් පැවැත්වීම, සැපයීම හෝ ඒ සඳහා පහසුකම් සැලැස්වීම කළ හැකි ය;";

(ඔ) ඒ උපවගන්තියේ (ච) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ච) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන ක්ෂේත්‍රවල හෝ මූල්‍ය කාර්යසාධක බලකායේ නිර්දේශවලට අනුකූල වන වෙනත් යම් ක්ෂේත්‍රයක අවදානම්, ප්‍රවණතා, විධික්‍රම, වර්ධනය වීම් සහ සිද්ධි අධ්‍යයන වර්ගීකරණ හා මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල්

සැපයීම අනාවරණය කිරීමේ, වැළැක්වීමේ සහ අධෛර්යයට පත් කිරීමේ දියුණු ක්‍රම පිළිබඳව පර්යේෂණ, සමාලෝචන හෝ ඇගයීම් පවත්වනු ලැබිය හැකි ය; ";

(ඕ) ඒ උපවගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(චඅ) යම් පර්යේෂණයක්, සමාලෝචනයක් හෝ ඇගයීමක් සඳහා අදාළ වන්නේ යයි මූල්‍ය බුද්ධි ඒකකය විසින් සලකනු ලබන යම් තොරතුරක් යම් ආයතනයකින් ලබා ගත හැකි ය;";

(ක) ඒ උපවගන්තියේ (ජ) ඡේදයේ, "මුදල් විශුද්ධීකරණය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට" යන වචන වෙනුවට "මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමට" යන වචන ආදේශ කිරීමෙන්;

(ග) ඒ උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ජඅ) මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමට අදාළ කාරණා සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන, නිසි බලධරයන් හෝ නඩු පවරන්නන් වෙත පුහුණුව සපයනු ලැබිය හැකි ය;";

(ච) ඒ උපවගන්තියේ (ට) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ට) යම් වාර්තාවක්, එවැනි වාර්තාවකින් ලබාගත් යම් තොරතුරක් හෝ එයට ලැබෙන වෙනත් යම් තොරතුරක්

විශ්ලේෂණය කිරීම හෝ ඇගයීම මත පදනම්ව, ඒ වාර්තාව හෝ තොරතුර යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය කරන යම් ක්‍රියාවක් පිළිබඳ හෝ, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදක් පිළිබඳ විමර්ශනයකට හෝ නඩු පැවරීමකට අදාළ වන බව සැක කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයට සාධාරණ හේතු ඇත්නම්, ඒ වාර්තාව, ඒ වාර්තාවෙන් ලබා ගත් තොරතුර හෝ එයට ලැබෙන ඒ වෙනත් තොරතුර හෝ 18 වන වගන්තිය හෝ 23 වන වගන්තිය යටතේ සිදු කරන ලද යම් පරීක්ෂණයක් මත පදනම් වූ යම් අධීක්ෂණමය සොයා ගැනීමක් 16 වන හා 17 වන වගන්තිවල දක්වා ඇති පරිදි හෙළිදරව් කිරීම හෝ හුවමාරු කිරීම කරනු ලැබිය හැකි ය;";

(ජ) ඒ උපවගන්තියේ (ඪ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඪ) තොරතුරු හුවමාරු කර ගැනීම, ඒකාබද්ධ අධීක්ෂණය සහ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම සඳහා අදාළ වන යම් වෙනත් කාරණයක් සම්බන්ධයෙන් යම් දේශීය හෝ ජාත්‍යන්තර ආණ්ඩුවේ ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් සමග හෝ වෙනත් අස්තිත්වයක් සමඟ යම් ගිවිසුමකට හෝ වැඩපිළිවෙලකට ඇතුළත් විය හැකි ය; සහ" ; සහ

(ට) ඒ උපවගන්තියේ (ඩ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඬ) වර්ෂය තුළ මූල්‍ය බුද්ධි ඒකකයේ කාර්යසාධනය පිළිබඳව වාර්ෂික වාර්තාවක් පළ කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) "ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක්-" යන වචන වෙනුවට "ගනුදෙනුවක්, ගනුදෙනු කිරීමට තැත් කිරීමක් හෝ යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන, ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක් සමඟ සම්බන්ධිත ගිණුමක්-" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ, "මුදල් විශුද්ධීකරණය වැලැක්වීමේ පනත" යන වචන වෙනුවට "මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "සූදානම්වීමක්," යන වචනය වෙනුවට "සූදානම් වීමක්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද කිරීමට සම්බන්ධ වීමක්,";

(ඉ) ඒ උපවගන්තියේ (i) වන අනු ඡේදයේ, "ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීම පිළිබඳව" යන වචන වෙනුවට, "ඒ ගනුදෙනුව, ගනුදෙනු කිරීමට තැත් කිරීම, වෙනත්

ගනුදෙනුව හෝ ගිණුම පිළිබඳව'' යන වචන ආදේශ කිරීමෙන්;

(ඊ) ''දින හතකට වැඩි නොවන'' යන වචනවල සිට ''එය විසින් ආයතනයට'' යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට ''වැඩ කරන දින දහහතරකට වැඩි නොවන යම් කාල පරිච්ඡේදයක් සඳහා, ඒ ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීම හෝ ඒ ගනුදෙනුව මගින් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීම මගින් බලපෑමක් ඇති කරන අරමුදල් සම්බන්ධයෙන් වූ වෙනත් යම් ගනුදෙනුවක් හෝ ඒ ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීම හෝ වෙනත් ගනුදෙනුව ආශ්‍රිත ගිණුම අත්හිටුවන ලෙසට හෝ කරගෙන යාම නොකළ යුතු බවට ලියවිල්ලකින් හෝ පැය විසිහතරක් ඇතුළත ලියවිල්ලකින් තහවුරු කරනු ලැබිය යුතු දුරකථන ඇමතුමක් මගින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් ආයතනයට'' යන වචන ආදේශ කිරීමෙන්;

(උ) ඒ උපවගන්තියේ ''විධාන කරනු ලැබිය හැකි ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''විධාන කරනු ලැබිය හැකි ය:''; සහ

(ඌ) ඒ උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන්:-

''එසේ වුවද, ඒ ගිණුමට උපචිත වන ලැබීම් කිසිවක් ඇත්නම්, ඒ ලැබීම් ඒ ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, උපයන ලද පොලිය මත යම් බද්දක් ගෙවනු ලැබිය යුතු නම් ඒ බද්ද ඒ ගිණුමෙන් ගෙවනු ලැබිය යුතු ය.'';

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ, "ඉදිරිපත් කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒ හා සම්බන්ධ නඩු කටයුතු රහසිගතව පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ වූ ආඥාවක් කරන ලද යම් ගනුදෙනුවක්, ගනුදෙනු කිරීමට තැත් කිරීමක් හෝ යම් තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන, ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක් ආශ්‍රිත ගිණුමක් සම්බන්ධයෙන්, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදක් සඳහා අධිචෝදනා ගොනු කර ඇති අවස්ථාවක, ඒ ආඥාව අධිකරණය විසින් ඊට හේතු වාර්තාගත කොට අවලංගු කළ හොත් මිස, ඒ ආඥාව ඒ වරද සම්බන්ධයෙන් වූ නඩු විභාගය අවසන් වන තෙක් හෝ ඒ වරදට වරදකරු කිරීමකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ අභියාචනය නිශ්චය කරනු ලබන තෙක් හෝ බලාත්මකව පැවතිය යුතු ය."; සහ

(4) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"මූල්‍ය බුද්ධි
ඒකකයේ
බලතල, කාර්ය
සහ කර්තව්‍ය.".

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"විදේශීය ආයතන සහ නියෝජ්‍යායතන වෙත තොරතුරු හෙළිදරව් කිරීම.

**16.** මූල්‍ය බුද්ධි ඒකකය විසින්, යම් වාර්තාවක් හෝ තොරතුරක්, ඒ වාර්තාව හෝ තොරතුර හෙළිදරව් කිරීම හෝ හුවමාරු කිරීම සම්බන්ධයෙන් 17 වන වගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුමේ හෝ වැඩපිළිවෙළේ දක්වා ඇති නියම හා කොන්දේසි මත -

(අ) විදේශීය රාජ්‍යයක නැතහොත් ජාත්‍යන්තර සංවිධානයක ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් හෝ, විදේශීය රාජ්‍යයක ආණ්ඩුව විසින් පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ඇති මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් සමඟ;

(ආ) විදේශීය නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් හෝ විදේශීය අධීක්ෂණ අධිකාරියක් සමඟ; හෝ

(ඇ) මූල්‍ය බුද්ධි ඒකකවල එග්මන්ට් කණ්ඩායමේ හෝ ඒ හා සමාන වැඩපිළිවෙළවල සාමාජිකයකු සමඟ,

හෙළිදරව් කිරීම හෝ හුවමාරු කිරීම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) මේ වගන්තියේ කිසිවක් මඟින්, නියාමනයට අනුකූල නොවීම් පිළිබඳ තොරතුරු සහ අධීක්ෂණ මගින් සොයාගත් තොරතුරු, අන්තර්හුවමාරුව මත පදනම්ව විදේශීය අධීක්ෂණ අධිකාරීන් සහ විදේශීය

නියාමන ආයතන සමඟ හුවමාරු කර ගැනීමෙන් මූල්‍ය බුද්ධි ඒකකය වළක්වනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) “මූල්‍ය බුද්ධි ඒකකය හෝ ඒ සඳහා එය විසින් බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින්,” යන වචන වෙනුවට “මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් බලය දෙන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධරයකු හෝ වෙනත් යම් සේවානියුක්තයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්,” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

“(අ) මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගවලට, රීතිවලට, නියමවලට හෝ විධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමට අදාළ වන වාර්තා ඇති බවට ඒ නිලධරයා, වෙනත් සේවානියුක්තයා හෝ වෙනත් තැනැත්තා සාධාරණ හේතු මත විශ්වාස කරන යම් පරිශ්‍රයක් වෙත යුක්ති සහගත වේලාවක දී ඇතුළු විය හැකි ය;”;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) “මූල්‍ය බුද්ධි ඒකකය හෝ යම් බලයලත් තැනැත්තකු වෙත,” යන වචන වෙනුවට “මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් බලය දෙන ලද

මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධරයා හෝ වෙනත් සේවානියුක්තයා හෝ වෙනත් තැනැත්තා වෙත,'' යන වචන ආදේශ කිරීමෙන්;සහ

(ආ) ''මේ පනතේ I වන, II වන හා III වන කොටස්වල හෝ පනත යටතේ සාදන ලද නියෝගවල දැක්වෙන පරිපාලක කටයුතු'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''මේ පනත හෝ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝග, රීති, නියම හෝ විධාන පරිපාලනය කිරීම'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''මේ පනතට අනුකූලව කටයුතු නොකිරීම හෝ නීතිවිරෝධී ක්‍රියාවලියක් සංස්ථාපනය කිරීමට තුඩු දෙන වරදකට සම්බන්ධ බවට'' යන වචන වෙනුවට ''මේ පනතට අනුකූලව කටයුතු නොකිරීමකට හෝ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදකට හෝ නීති විරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය කරන වරදකට අදාළ යම් විමර්ශනයකට සම්බන්ධ බවට'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

''පොත්, වාර්තා
ආදිය පරීක්ෂා
කිරීමට මූල්‍ය බුද්ධි
ඒකකයට ඇති
බලය.''.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"අනුකූලව කටයුතු කිරීම බලාත්මක කිරීම සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම.

**19.** (1) (අ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගයක්, රීතියක් හෝ නියමයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු;

(ආ) මේ පනත යටතේ තමා වෙත පනවන ලද යම් කොන්දේසියක් හෝ සීමා කිරීමක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු; හෝ

(ඇ) මේ පනත යටතේ තමා වෙත නිකුත් කරන ලද හෝ පනවන ලද යම් ලිඛිත දැන්වීමක්, විධානයක් හෝ වෙනත් යම් අවශ්‍යතාවයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු,

ඒ උල්ලංඝනය කිරීමේ හෝ පැහැර හැරීමේ ස්වභාවය සහ බරපතළකම සහ අදාළ අවස්ථාවල දී, ඒ උල්ලංඝනය කිරීම හෝ පැහැර හැරීම නිවැරදි කිරීමට ඒ තැනැත්තා විසින් පසුව ගන්නා ලද ක්‍රියාමාර්ග සැලකිල්ලට ගනිමින්, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් පනවනු ලබන පරිපාලනමය දණ්ඩන එකකට හෝ වැඩි ගණනකට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිපාලනමය දණ්ඩනයක්-

(අ) ලිඛිත අවවාද කිරීමක්;

(ආ) නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් ඇතුළත ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට කරනු ලබන නියමයක්;

(ඇ) ප්‍රසිද්ධ ප්‍රකාශයක්;

(ඈ) නතර කිරීමේ සහ වැළැක්වීමේ නියමයක්;

(ඉ) මුදල් දඩයක්;

(ඊ) ආයතනයක් නියාමනය කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා අදාළ වන යම් ලිඛිත නීතියක් ප්‍රකාරව අවසර දෙනු ලැබිය හැකි පරිදි-

(i) ලිඛිත අවවාද කිරීමක් නිකුත් කිරීමට;

(ii) ආයතනයක් විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරය හෝ වෘත්තිය පිළිබඳ බලපත්‍රය අත්හිටුවීමට හෝ සීමා කිරීමට හෝ ඒ ව්‍යාපාරය හෝ වෘත්තිය පවත්වාගෙන යාම තහනම් කිරීමට;

(iii) ආයතනයක බලපත්‍රය අවලංගු කිරීමට; හෝ

(iv) අදාළ ලිඛිත නීතියේ විධිවිධාන ප්‍රකාරව දණ්ඩනයක් පැනවීම හෝ, අධීක්ෂණ, නියාමන, ස්වයං නියාමන, බලපත්‍ර ලබා දීමේ හෝ ලියාපදිංචි කිරීමේ අධිකාරියට අදාළ ක්ෂේත්‍රය තුළ සේවානියුක්තියෙහි, වෙළෙඳාමෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නිරත වීම සම්බන්ධයෙන් තැනැත්තකුට කාල තහනමක් හෝ සීමා කිරීමක් පැනවීමට,

අවස්ථාවෝචිත පරිදි, ඒ ආයතනයේ අධීක්ෂණ, නියාමන, ස්වයං නියාමන, බලපත්‍ර ලබා දීමේ හෝ ලියාපදිංචි කිරීමේ අධිකාරියට නිර්දේශ කිරීමක්,

විය හැකි ය.

(3) (අ) මේ වගන්තිය යටතේ වූ යම් අවස්ථාවක් සම්බන්ධයෙන් හෝ උල්ලංඝනය කිරීමක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් තැනැත්තකු මත පනවනු ලැබිය හැකි මුදල් දඩය රුපියල් මිලියන සියයක් නො ඉක්මවිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් තැනැත්තා විසින් තදනන්තරව සිදු කරන යම් උල්ලංඝනය කිරීමක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා රුපියල් මිලියන දෙසියයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ පනවනු ලබන මුදල් දඩයක් එකතු කිරීම සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා වගකිව යුතු අතර, එසේ එකතු කරනු ලබන මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ පනවන ලද මුදල් දඩයකට යටත් වන තැනැත්තකු ඒ මුදල් දඩය ගෙවීමට අපොහොසත් වේ නම්, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින්, ඒ මුදල් දඩය ගෙවීමට නියම කරන ආඥාවක් ලබා ගැනීම සඳහා කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණය වෙත ඒකපාර්ශ්වික ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, ඒ ආඥාව කරනු ලැබූ විට, ඒ මුදල, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අයකර ගනු ලබන ආකාරයට ම අයකර ගනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ පරිපාලනමය දණ්ඩනයක් පැනවීම හේතුවෙන්, ආයතනයක අධීක්ෂණ, නියාමන, ස්වයං නියාමන, බලපත්‍ර ලබා දීමේ හෝ ලියාපදිංචි කිරීමේ අධිකාරියක් විසින්, ඒ ආයතනය නියාමනය කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා අදාළ වන යම් ලිඛිත නීතියක් හෝ රීති ප්‍රකාරව අවසර දෙනු ලැබිය හැකි පරිදි, ඒ ආයතනය විසින් ව්‍යාපාරයක් හෝ වෘත්තියක් කරගෙන යාම අත්හිටුවීම හෝ ව්‍යාපාරයක් හෝ වෘත්තියක් කරගෙන යාම සඳහා ඒ ආයතනය වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රයක් හෝ බලයක් අවලංගු කිරීම ඇතුළුව, එහෙත් ඊට සීමා නොවන, යම් නියාමන හෝ විනයානුකූල පියවර ගැනීමෙන් වළක්වනු නො ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ පුද්ගල මණ්ඩලයක් වෙත මුදල් දඩයක් පනවනු ලබන අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ මුදල් දඩය පනවනු ලබන අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකු වන සෑම තැනැත්තකු ම; නැතහොත්

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නොවේ නම්, ඒ මුදල් දඩය පනවනු ලබන අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ සභාපතිවරයා, කළමනාකාරවරයා, ලේකම්වරයා, හවුල්කරු, සාමාජිකයා හෝ වෙනත් සමාන නිලධරයකු වන සෑම තැනැත්තකු ම,

උල්ලංඝනය කිරීම හෝ පැහැර හැරීම පිළිබඳව තමාට දැනීමක් නොතිබූ බව හෝ මේ පනතේ

අදාළ විධිවිධානවලට හෝ මේ පනත යටතේ සාදන ලද, නිකුත් කරන ලද හෝ පනවන ලද අදාළ නියෝගවලට, රීතිවලට, නියමවලට, කොන්දේසිවලට, සීමා කිරීම්වලට, දැන්වීම්වලට, විධානවලට හෝ වෙනත් විධානවලට අනුකූලව කටයුතු කිරීමට වගබලා ගැනීම සඳහා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔහු ඔප්පු කරන්නේ නම් මිස, ඒ මුදල් දඩය ගෙවීමට යටත් විය යුතු ය.

(8) (1) වන උපවගන්තිය යටතේ යම් ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට කරන ලද නියමයකට හෝ නතර කිරීමේ සහ වැළැක්වීමේ නියමයකට අනුකූලව කටයුතු කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරින අවස්ථාවක, මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින්, කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීම මත, ඒ තැනැත්තා විසින් යුක්තිසහගත හේතුවක් නොමැතිව ඒ නියමයට අනුකූලව කටයුතු කිරීම සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පැහැර හරිනු ලැබ ඇති බව අධිකරණය සෑහීමට පත් කිරීමෙන් අනතුරුව, ඒ බැඳීමට අනුකූලව කටයුතු කිරීම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි අධිකරණය සලකනු ලබන යම් නියමවලට යටත්ව, ඒ තැනැත්තාට සහ ඒ තැනැත්තාගේ යම් හෝ සියලු නිලධරයන්ට හෝ සේවානියුක්තයන්ට විරුද්ධව ආඥාවක් ලබාගත හැකි ය.”.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ “මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු,” යන වචන වෙනුවට “මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා, නිලධරයකු,” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ ඒ තැනැත්තාට පනවන ලද කාර්යයන් කිරීමේ දී හෝ පවරන ලද කර්තව්‍ය ඉටු කිරීමේ දී ඒ තැනැත්තා විසින් ලබාගත් හෝ ඒ තැනැත්තාට දැන ගැනීමට ලැබුණු යම් තොරතුරක් හෝ කාරණයක්-

(අ) ඒ කාර්ය කිරීමේ හෝ ඒ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා;

(ආ) යම් අධිකරණයක් විසින් එසේ කිරීමට නීත්‍යානුකූලව නියම කරන ලද විට;

(ඇ) මේ පනතේ යම් විධිවිධානයක හෝ ඊට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක අන්තර්ගත යම් අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා හෝ ඒ අවශ්‍යතාවය ඉටු කිරීම පැහැර හැරීමක් පිළිබඳව අනාවරණය කිරීම සඳහා;

(ඈ) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා; හෝ

(ඉ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 21 වන වගන්තියේ කාර්ය සඳහා,

හැර, හෙළිදරව් කරනු නොලැබිය යුතු ය.".

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ කොටස ඒ ප්‍රඥප්තියේ IIIඅ වන කොටස ලෙස බලාත්මක විය යුතු ය:-

ප්‍රධාන ප්‍රඥප්තියට IIIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම

**“IIIඅ වන කොටස**

**මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ජාතික කමිටුව පිහිටුවීම**

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ජාතික කමිටුව පිහිටුවීම.

**21අ.** මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සඳහා සහ ඒ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම සඳහා (මේ පනතේ “ජාතික කමිටුව” යනුවෙන් සඳහන් කරනු ලබන) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ජාතික කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

ජාතික කමිටුවේ සංයුතිය.

**21ආ.** (1) ජාතික කමිටුව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) මහ බැංකුවේ අධිපතිවරයා;

(ආ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඇ) විදේශ කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඇ) අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඉ) ආරක්ෂාව පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඊ) මහජන ආරක්ෂාව හෝ අභ්‍යන්තර ආරක්ෂාව පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(උ) නීතිපතිවරයා;

(ඌ) පොලිස්පතිවරයා; සහ

(එ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(2) ජාතික කමිටුව විසින් ජාතික කමිටුවේ රැස්වීම් සඳහා-

(අ) යම් රජයේ නිලධරයකුට; හෝ

(ආ) ජාතික කමිටුවේ කාර්ය සහ කර්තව්‍ය කිරීම සහ ඉටු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකුගේ විශේෂඥතාවය හෝ දැනුම අවශ්‍ය යයි සලකනු ලබන්නේ ද, එවැනි වෙනත් යම් තැනැත්තකුට,

ආරාධනය කරනු ලැබිය හැකි ය.

(3) මහ බැංකුවේ සියලු නියෝජ්‍ය අධිපතිවරු ජාතික කමිටුවේ රැස්වීම් සඳහා සහභාගී විය යුතු ය.

(4) මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා ජාතික කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

ජාතික කමිටුවේ සභාපතිවරයා.

**21ඈ.** (1) මහ බැංකු අධිපතිවරයා ජාතික කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.

(2) ජාතික කමිටුවේ සභාපතිවරයා නොමැති අවස්ථාවක දී, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ජාතික කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කළ යුතු ය.

ජාතික කමිටුවේ රැස්වීම්.

**21ඈ.** ජාතික කමිටුවේ රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට එක් වරක්වත් කැඳවනු ලැබිය යුතු ය. යම් විශේෂ රැස්වීමක් සභාපතිවරයාගේ අභිමතය පරිදි හෝ සාමාජිකයකුගේ ලිඛිත ඉල්ලීම මත සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය හැකි ය.

ජාතික කමිටුවේ කාර්ය සහ කර්තව්‍ය.

**21ඉ.** ජාතික කමිටුව විසින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන කාර්ය සහ කර්තව්‍ය කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:-

(අ) ශ්‍රී ලංකාව තුළ පවතින මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් ඵලදායී ලෙස හඳුනා ගනු ලබන බවට සහ තක්සේරු කරනු ලබන බවටත්, ඒ අවදානම් තක්සේරු කිරීම් යාවත්කාලීන වන බවටත් සහතික වීම;

(ආ) අවදානම් තක්සේරු කිරීම්වල ප්‍රතිඵල පිළිබඳ තොරතුරු අදාළ සියලු නිසි

බලධරයන් සහ ස්වයං නියාමන අධිකාරීන් සහ ආයතන වෙත සපයනු ලබන බවට සහතික වීම;

(ඇ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය, හඳුනාගනු ලැබූ අවදානම්වලට අනුකූලව සකස් කරනු ලබන බවටත්, ඒ ජාතික ප්‍රතිපත්තිය නිතිපතා සමාලෝචනය කරනු ලබන බවටත් සහතික වීම සඳහා අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලය වෙත සහාය වීම හෝ උපදෙස් ලබා දීම;

(ඈ) අදාළ පාර්ශ්වකරුවන් විසින් ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම;

(ඉ) මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් දක්වා ඇති ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් පාලනය කිරීම සහ අවම කිරීම පිණිස, ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වකරුවන් වෙත උපදෙස් ලබා දීම සහ මගපෙන්වීම;

(ඊ) ඒ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ග ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධීකරණය සහතික කිරීම;

(ඥ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය සහ ඒ ආශ්‍රිත උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය වන්නේ නම්, නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන කාල රාමු ද සමග, අදාළ පාර්ශ්වකරුවන් වෙත සාමාන්‍ය හෝ විශේෂ නිර්දේශ සිදු කිරීම;

(ඍ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග, මෑත කාලීන ප්‍රවනතා, සිද්ධි අධ්‍යයන වර්ගීකරණ සහ නැගී එන තර්ජන මත පදනම්ව ජාතික කමිටුවේ නිර්දේශ සහ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා යම් නියාමන අධිකාරියකට හෝ පාර්ශ්වකරුවකුට සාමාන්‍ය හෝ විශේෂ විධාන ලබා දීම සහ අවශ්‍ය වන්නේ නම්, ඒ විධාන ක්‍රියාත්මක කිරීම සඳහා කාල රාමු නිශ්චිතව දැක්වීම;

(එ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති හෝ උපායමාර්ග සම්බන්ධයෙන් අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඒ) මේ වගන්තියේ සඳහන් ජාතික කමිටුවේ කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඒ ජාතික කමිටුවට

සහාය වීම සඳහා, අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවල දී, ජාතික කමිටුවේ සාමාජිකයන්ගෙන් නැතහොත්, යම් රජයේ නිලධරයකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ විශේෂඥතාවය හෝ දැනුම අවශ්‍ය යයි සලකනු ලබන්නේ ද, ඒ රජයේ නිලධරයාගෙන් හෝ වෙනත් තැනැත්තාගෙන් සමන්විත උපකමිටු පත් කිරීම;

(ඔ) ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ප්‍රගතිය සහ ඊට ආනුෂංගික කාරණා දක්වමින් වාර්ෂිකව සහ ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී, අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීම; සහ

(ඕ) යම් කාරණයක් සම්බන්ධයෙන් හදිසි පදනම මත අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීම.

21ඊ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම.

**21ඊ.** (1) 21ඉ වන වගන්තිය යටතේ විධානයක් හෝ නිර්දේශයක් නිකුත් කර ඇත්තේ යම් නියාමන අධිකාරියක් හෝ පාර්ශ්වකරුවකු වෙත ද, ඒ නියාමන අධිකාරිය හෝ පාර්ශ්වකරු විසින් ඒ විධානය හෝ නිර්දේශය සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් ක්‍රියාත්මක කිරීමට අදහස් නොකරන අවස්ථාවක දී හෝ ඒ නියාමන අධිකාරියට හෝ පාර්ශ්වකරුට හෝ ඒ විධානය හෝ නිර්දේශය සම්පූර්ණයෙන් හෝ එහි කොටසක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඒ නියාමන අධිකාරිය හෝ පාර්ශ්වකරු විසින් ඒ සඳහා වන හේතු ඒ විධානය හෝ නිර්දේශය ලැබුණු දින සිට සාධාරණ කාලසීමාවක් ඇතුළත ජාතික කමිටුව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එසේ දක්වන ලද හේතු පිළිබඳව ජාතික කමිටුව සෑහීමට පත් නොවන්නේ නම් හෝ, ඒ නියාමන අධිකාරිය හෝ පාර්ශ්වකරු යම් වලංගු හේතුවක් නොමැතිව ඒ විධානය හෝ නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අපොහොසත්ව ඇති බවට හෝ ඒ විධානය හෝ නිර්දේශය ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත මට්ටමට නොමැති බවට ජාතික කමිටුවේ මතය වන්නේ නම්, ජාතික කමිටුව විසින් ඒ කරුණ, එය යොමු කිරීම සඳහා වූ හේතු ද සමග, සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යවරයා හරහා අමාත්‍ය මණ්ඩලය වෙත වහාම යොමු කරනු ලැබිය හැකි ය.

අමාත්‍ය මණ්ඩලය විසින් පාර්ශ්වකරුවන් වෙත විධාන නිකුත් කිරීම.

**21උ.** (1) අමාත්‍ය මණ්ඩලය විසින් -

(අ) 21ඉ වන වගන්තියේ (එ) ඡේදය යටතේ ජාතික කමිටුව විසින් කරන ලද යම් නිර්දේශයක් ක්‍රියාත්මක කරන ලෙසට යම් පාර්ශ්වකරුවකුට විධාන කරනු ලැබිය හැකි ය;

(ආ) 21ඊ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ජාතික කමිටුව විසින් කරන ලද යොමු කිරීමක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

(2) අවස්ථාවෝචිත පරිදි, සෑම පාර්ශ්වකරුවකු විසින් ම හෝ නියාමන අධිකාරියක් විසින් ම (1) වන උපවගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් විධානයකට හෝ ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයකට අවනත වීම හෝ ඊට අනුකූලව කටයුතු කිරීම කරනු ලැබිය යුතු ය.”.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "විගණකවරයකුට," යන වචනය වෙනුවට, "ආයතනයට බාහිරව කටයුතු කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකුට," යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) "යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් පිළිබඳව යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විමර්ශනයකට හෝ නඩු පැවරීමකට අදාළ වේ යයි;" ;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ, "ක්‍රියාවක් සංස්ථාපනය කෙරෙන යම් ක්‍රියාවක් කිරීමට සම්බන්ධ වී ඇතැයි; හෝ" යන වචන වෙනුවට "ක්‍රියාකාරකමක් සංස්ථාපනය කරන්නා වූ යම් වරදක් සිදු කිරීමට සම්බන්ධ වී ඇතැයි;" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඇඅ) සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද සංස්ථාපනය කරන්නා වූ යම් ක්‍රියාවක් සිදු කිරීමට සම්බන්ධ වී ඇතැයි; හෝ"; සහ

(5) "ආයතනයේ අධීක්ෂණ අධිකාරිය හෝ විගණකවරයා විසින්," යන වචන වෙනුවට, "ඒ අධීක්ෂණ අධිකාරිය හෝ සුදුසුකම්ලත් විගණකවරයා විසින්," යන වචන ආදේශ කිරීමෙන්.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"අධීක්ෂණ හෝ නියාමන අධිකාරිය විසින් අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම.

**23.** (1) අවස්ථාවෝචිත පරිදි ආයතනයක අධීක්ෂණ හෝ නියාමන අධිකාරිය විසින්-

(අ) අවදානම් මත පදනම්ව අවශ්‍ය විය හැකි නිරන්තර පරීක්ෂණ මගින්, මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද නියෝගවලට, රීතිවලට, නියමවලට, මාර්ගෝපදේශවලට, විධානවලට සහ චක්‍රලේඛවලට අනුකූලව ආයතන කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගෙන, යම් අනුකූලව කටයුතු නොකිරීමක් වෙතොත් ඒ පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(ආ) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදක් හෝ නීති විරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය කරන්නා වූ යම් වරදක් සම්බන්ධයෙන් වන යම් විමර්ශනයක දී, නඩු පැවරීමක දී හෝ නඩු කටයුතුවල දී නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතන සහ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) යම් අධීක්ෂණ හෝ නියාමන අධිකාරියක් නොමැති අවස්ථාවක දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මේ පනතේ විධිවිධාන යටතේ අවශ්‍ය විය හැකි නිරන්තර පරීක්ෂණ මගින් (1) වන උපවගන්තියේ සඳහන් යම් තහවුරු කිරීමක් සිදු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ V වන කොටසේ 24 වන වගන්තියට පෙරාතුව ම දැක්වෙන ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

**"දේශ සීමාවේ දී මුදල් පිළිබඳව වාර්තා කිරීම"**

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) යම් නැවක් හෝ ගුවන් යානයක් මතට පිවිසීමට හෝ යම් නැවකින් හෝ ගුවන් යානයකින් බැහැර වීමට සූදානම් ව සිටින, නැතහොත් යම් නැවක් හෝ ගුවන් යානයක් මතට පිවිස ඇති හෝ යම් නැවකින් හෝ ගුවන් යානයකින් බැහැර වී ඇති,"; සහ

(ආ) "තැනැත්තා සතුව ඔහුගේ හෝ ඇයගේ සන්තකයේ යම් මුදලක් හෝ (5) වන උපවගන්තිය යටතේ වාර්තාවක් අවශ්‍ය වන්නා වූ ධාරක සාධන පත්‍ර කිසිවක් ඇද්දැයි නිශ්චය කිරීමේ" යන වචන සහ ඉලක්කම වෙනුවට "ඒ තැනැත්තාගේ සන්තකයේ (5) වන උපවගන්තිය යටතේ වාර්තාවක් අවශ්‍ය වන්නා වූ යම් මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර කිසිවක් තිබේ ද යන්න නිශ්චය කිරීමේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(4) (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂා කිරීමක් හෝ සෝදිසි කිරීමක් සිදු කිරීමේ දී සොයා ගන්නා ලද මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර, නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීම පිළිබඳ සාක්ෂි විය හැකි යයි විශ්වාස කිරීමට සාධාරණ හේතු බලයලත් නිලධරයකුට ඇති අවස්ථාවක, ඒ බලයලත් නිලධරයා විසින්, ඒ මුදල් හෝ ගනුදෙනු

කළ හැකි ධාරක සාධන පත්‍ර තහනමට ගනු ලැබිය යුතු ය.'';

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(5) (4) වන උපවගන්තිය යටතේ මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර තහනමට ගනු ලැබූ බලයලත් නිලධරයකු විසින්, ඒ තහනමට ගැනීම පිළිබඳව වහාම මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.''; සහ

(4) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

''දේශ සීමාවේ
දී මුදල් පිළිබඳව
වාර්තා කිරීම.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ''මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර කිසිවක්,'' යන වචන වෙනුවට ''මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර කිසිවක්,'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (අ) ඡේදයේ ''නීති විරෝධී ක්‍රියාවලියක්'' යන වචන වෙනුවට ''නීති විරෝධී ක්‍රියාකාරකමක්'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (ආ) ඡේදයේ ''නීති විරෝධී ක්‍රියාවලියක් කිරීමෙහිලා'' යන වචන වෙනුවට ''නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙහිලා'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ ''ප්‍රකාර,'' යන වචනය වෙනුවට ''ප්‍රකාර,'' යන වචනය ආදේශ කිරීමෙන්.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ "ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර" හෝ "ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර" යන වචන යෙදී ඇති සෑම තැනක ම ඒ වචන වෙනුවට "ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණය විසින්, එයට කරනු ලබන ඉල්ලීමක් මත, 24 වන වගන්තියේ (4) වන උපවගන්තිය හෝ 25 වන වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර-

(අ) ඒ මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමෙන් උපයාගෙන ඇති බවට හෝ යම් තැනැත්තකු විසින් යම් වරදක් සිදු කිරීමේ දී භාවිත කිරීම සඳහා හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හා සම්බන්ධ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් භාවිත කිරීම සඳහා අදහස් කරනු ලබන බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති බවට; සහ

(ආ) එහි ප්‍රභවය හෝ මූලාරම්භය පිළිබඳව වැඩිදුර විමර්ශන සිදු කරනු ලබන අතරතුර එය නොකඩවා රඳවා තබා ගැනීම සාධාරණ වන බවට,

ඒ අධිකරණය විසින් සෑහීමට පත්ව, තහනමට ගනු ලැබූ දින සිට මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා නොකඩවා රඳවා තබා ගැනීමේ ආඥාවක්

කරනු ලබන්නේ නම් මිස, ඒ මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර තහනමට ගැනීමෙන් පසු වැඩ කරන දින පහකට වඩා වැඩි කාලයක් රඳවා තබා ගැනීම නොකළ යුතු ය.''; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ ''ඒකාබද්ධ අරමුදලට රාජසන්තක කරනු ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට ''රාජසන්තක කර ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

''නිශ්චිතව දක්වන ලද මුදලට වඩා වැඩි මුදලක් සහිතව, වාර්තා නොකොට ශ්‍රී ලංකාවට පැමිණීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම වරදක් බව.

**27.** (1) ස්වකීය සන්තකයේ හෝ මාර්ගෝපකරණවල, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වටිනාකම ඉක්මවන මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර සහිතව සහ එම කරුණ ප්‍රථමයෙන් අදාළ බලධරයාට වාර්තා නොකොට ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව යන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට ඒ මුදල්වල හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍රවල වටිනාකම මෙන් තුන් ගුණයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබ ඇති වටිනාකම ඉක්මවන මුදල් හෝ ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර සියලු බැඳීම්වලින් නිදහස්ව රාජසන්තක කරනු ලැබිය යුතු ය.''.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''වරදකට වරදකරු වන අතර,'' යන වචනවල සිට ඒ උපවගන්තිය අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට ''වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ''නීති විරෝධී කටයුත්තක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් හෝ මුදල් විශුද්ධීකරණය හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ වරදක්'' යන වචන වෙනුවට ''නීති විරෝධී ක්‍රියාකාරකමක් සංස්ථාපනය කෙරෙන වරදක් හෝ මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම යන වරදක්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ''ඒ තැනැත්තා වරදකට වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට'' යන වචන වෙනුවට ''ඒ තැනැත්තා වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''18 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව කටයුතු නොකරන්නේ නම්, ඔහු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''18 වන වගන්තියේ

(2) වන උපවගන්තියට අනුකූලව කටයුතු නොකරන්නේ නම්, ඒ තැනැත්තා වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(4) යම් තැනැත්තකු 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වූ වරදක් පිළිබඳව හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද පිළිබඳව විමර්ශනය කිරීමකට යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් අදාළ වන බව දැන දැනම හෝ අදාළ වන බව විශ්වාස කිරීමට හේතු තිබිය දී ඒ ලේඛනයේ හෝ ද්‍රව්‍යයේ සත්‍යතාවය හෝ සම්පූර්ණත්වය කෙරෙහි බලපාන ව්‍යාජ ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් සාදන්නේ නම් හෝ යම් සැඟවීමක් කරන්නේ නම් හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන්නේ නම්, ඒ තැනැත්තා වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.”;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(5) යම් තැනැත්තකු 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හෝ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ වූ වරදක්

පිළිබඳව හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද පිළිබඳව විමර්ශනය කිරීමකට යම් ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් අදාළ වන බව දැන දැනම හෝ අදාළ වන බව විශ්වාස කිරීමට හේතු තිබිය දී ඒ ලේඛනය හෝ ද්‍රව්‍යය විනාශ කරන්නේ නම් හෝ අන්‍යාකාරයකින් බැහැර කරන්නේ නම්, ඒ තැනැත්තා වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.";

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(6) ආයතනයක් සමග ව්‍යාජ හෝ අසත්‍ය නමකින් ගිණුමක් විවෘත කරන හෝ ක්‍රියාත්මක කරන හෝ විවෘත කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට බලය දෙන, හෝ ආයතනයක් සමඟ ගිණුමක් විවෘත කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී අසත්‍ය තොරතුරු සපයන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(7) යම් තැනැත්තකු, 15 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සැපයීමට අවශ්‍ය වන යම් තොරතුරු සැපයීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම් ඒ තැනැත්තා වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ

විට රුපියල් මිලියන දහයක් නො ඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.”; සහ

(7) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

“අසත්‍ය තොරතුරු දීම ආදිය වරදක් බව.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 28අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 28අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි.

**28අ.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම හෝ වෙනත් නිලධරයකු ම;

(ආ) ආයතනයක් නම්, ඒ ආයතනයේ සෑම හවුල්කරුවකු ම; සහ

(ඇ) ආයතනයක් නොවන, සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම සහ ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිව යුතු සෑම නිලධරයකු ම,

ඒ වරද සිදු කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා, හවුල්කරු හෝ පුද්ගලයා ඒ වරද ඔහුගේ අනුදැනුමකින් තොරව සිදු කරනු ලැබ ඇති බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු සියලු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කළහොත්, ඔහු ඒ වරද සිදු කර ඇති ලෙසට සලකනු නො ලැබිය යුතු ය.”.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

“(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මඟින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් යම් ව්‍යාපාරයක් “නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක්” හෝ “මූල්‍ය ව්‍යාපාරයක්” ලෙස නියම කිරීම; සහ

(ආ) ගනුදෙනුවකට හෝ ගිණුමකට අදාළව යම් තැනැත්තකු ගනුදෙනුකරුවකු ලෙස නියම කිරීම.”.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 29අ වන, 29ආ වන සහ 29ඇ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:- ප්‍රධාන ප්‍රඥප්තියට 29අ වන, 29ආ වන, සහ 29ඇ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

“රීති. **29අ.** (1) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය දී ඇත්තා වූ හෝ නියම කර ඇත්තා වූ යම් කාරණයක් සම්බන්ධයෙන් මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් මේ පනතේ විධිවිධානවලට යටත්ව රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) යම් නිශ්චිත ගනුදෙනුකරුවකු හෝ ගනුදෙනුකරුවන් පන්තියක් හඳුනා ගැනීම හෝ සත්‍යාපනය කර ගැනීම සඳහා අවශ්‍ය නිල හඳුනා ගැනීමේ ලේඛන හෝ වෙනත් විශ්වසනීය මූලාශ්‍ර ලේඛන හෝ තොරතුරු හෝ දත්ත හෝ සාක්ෂි;

(ආ) 2 වන වගන්තියේ කාර්ය සඳහා හඳුනා ගැනීමේ සහ සත්‍යාපනය කර ගැනීමේ අවශ්‍යතා පිළිබඳ කාලය;

(ඇ) ආයතනයක ගනුදෙනුකරුවන් විසින් කරගෙන යනු ලබන ගනුදෙනුවලට හඳුනා ගැනීමේ සහ සත්‍යාපනය කර ගැනීමේ අවශ්‍යතා අදාළ විය යුතු අවස්ථානුගත තත්ත්වයන් හෝ ආකාරය හෝ ඊට අදාළ නියමිත සීමාව;

(ඈ) ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සරල කරන ලද නිසි උද්යෝගී පියවර අනුගමනය කිරීම;

(ඉ) වාර්තා තැබීම, වාර්තා කිරීම පිළිබඳ බැඳීම්, සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම, ගනුදෙනු අත්හිටුවීම සහ ගනුදෙනුකරුවන් පිරික්සීම;

(ඊ) 2 වන වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති පරිදි අවදානම මත පදනම් වූ ප්‍රවේශය අදාළ කර ගැනීම;

(උ) 2 වන වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති පරිදි ගනුදෙනුකරුවකුගේ අර්ථලාභී අයිතිකරුගේ අනන්‍යතාව හඳුනා ගැනීම හෝ අනන්‍යතාව සත්‍යාපනය කර ගැනීම;

(ඌ) මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් ගනුදෙනු කාණ්ඩයක් සම්බන්ධයෙන් උත්පාදකයා සහ ප්‍රතිලාභියා හෝ, වෙනත් යම් සම්බන්ධිත පාර්ශ්වයකට අදාළ තොරතුරු ලබා ගැනීම; සහ

(එ) 2 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ආයතන සමග තොරතුරු හුවමාරු කර ගැනීම.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීති මගින් පනවන ලද නියම හා කොන්දේසි, විවිධ ආයතන කාණ්ඩ, විවිධ ගනුදෙනු කාණ්ඩ හෝ විවිධ ගනුදෙනුකරුවන් කාණ්ඩ සම්බන්ධයෙන් වෙනස් විය හැකි ය.

(4) මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින්, මේ වගන්තිය යටතේ රීති සෑදීමේ දී, මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

විධාන ආදිය නිකුත් කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියාට ඇති බලය.

**29ආ.** මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින්, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාළව, ලිඛිතව විධාන, චක්‍රලේඛ හෝ මාර්ගෝපදේශ ආයතන වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

රීති ආදිය මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු බව.

**29ඇ.** මේ පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද දැනට පවත්නා සියලු රීති, විධාන, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ, 14ආ වන වගන්තිය යටතේ පත් කරන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් සාදනු ලැබ ඇති හෝ නිකුත් කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 30අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 30අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“විදේශීය බැංකුවල සහතික කරන ලද ප්‍රකාශවල ආවේශ්‍යතාව.

**30අ.** (1) මේ පනත යටතේ වන නඩු පැවරීමක දී, විදේශීය බැංකුවක සහතික කරන ලද ප්‍රකාශයක්, එහි සඳහන් කාරණාවල ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරන තෙක්, ඒ පිළිබඳ සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සහතික කරන ලද ප්‍රකාශයක් ව්‍යාජ අනුකරණයක් බවට හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ ප්‍රකාශයක් බවට යම් තැනැත්තකු චෝදනා කරන අවස්ථාවක දී, ඒ සිද්ධිමය කරුණ ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතුව පැවතිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා “සහතික කරන ලද ප්‍රකාශය” යන්නෙන්, බැංකුවේ වාර්තාවල යම් සටහනක් ඇතුළත් වන ප්‍රකාශයක් වන්නා වූ ද, ඒ ප්‍රකාශය ඒ සටහනේ සත්‍ය ප්‍රකාශයක් බවටත්, ඒ සටහන සාමාන්‍ය සහ සුපුරුදු ව්‍යාපාරික කටයුතු අතරෙහි සිදු කළ බවටත්, ඒ සටහනේ වාර්තාවක් දැනට ද ඒ බැංකුව භාරයේ පවතින බවටත් වූ ලිඛිත සහතිකයක් ඒ ප්‍රකාශය අවසානයේ දරන්නා වූ ද, ඒ බැංකුවේ බලයලත් නිලධරයකු විසින් සහතික කරන ලද ප්‍රකාශයක් අදහස් වේ.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ආයතනයක් විසින්," යන වචන වෙනුවට, "මේ පනතේ විධිවිධාන සමග අනුකූලව කටයුතු කිරීමට මේ පනත මගින් හෝ මේ පනත යටතේ නියම කරනු ලැබ ඇති සෑම ආණ්ඩුවේ ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් ම, නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනයක් ම, අධීක්ෂණ අධිකාරියක් ම, ආයතනයක් ම හෝ තැනැත්තකු ම විසින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"මේ පනතේ
විධිවිධානවලට
අනුකූලව කටයුතු
කිරීමට ආණ්ඩුවේ
ආයතනවලට හෝ
නියෝජ්‍යායතනවලට,
ආයතනවලට ආදියට
යුතුකමක් ඇති බව.".

ප්‍රධාන ප්‍රඥප්තියට 31අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 31අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

"ආයතනවල විදේශීය ශාඛාවලට සහ පාලිත සමාගම්වලට මේ පනත අදාළ වීම.

**31අ.** (1) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීමට අදාළ වන මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගවල, රීතිවල, නියමවල සහ විධානවල විධිවිධානවලට වඩා දැඩි බවින් අඩු අවශ්‍යතා විදේශ රටවල හෝ විදේශීය රාජ්‍යවල අදාළ ලිඛිත නීතිවලින් නියම කරනු ලබන අවස්ථාවක, ආයතනයක් විසින් විදේශීය රටවල හෝ විදේශීය රාජ්‍යවල ඇති ස්වකීය ශාඛාවන් සහ බහුතර හිමිකමක් සහිත පාලිත සමාගම්

මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගවල, රීතිවල, නියමවල සහ විධානවල විධිවිධානවලට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගත යුතු ය.

(2) යම් විදේශීය රටක හෝ විදේශීය රාජ්‍යයක අදාළ ලිඛිත නීතිවලින් මේ පනතේ විධිවිධාන සහ මේ පනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් නියෝගවල, රීතිවල, නියමවල සහ විධානවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවසර නොදෙන අවස්ථාවක, ඒ සෑම ආයතනයක් විසින් ම මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම පිළිබඳ අවදානම් කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට සුදුසු අතිරේක පියවර අදාළ කර ගනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා, අතිරේක පියවර යන්නට අමතර පූර්වෝපාය සහ වැඩි කරන ලද සුපරීක්ෂණය සහ පාලන ඇතුළත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“අර්ථ නිරූපණය.

**33.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

“ගිණුම” යන්නෙන්, ආයතනයක් විසින්-

(අ) මුදල් තැන්පතු භාර ගන්නා;

(ආ) මුදල් ආපසු ගැනීමට අවසර දෙන;

(ඇ) ඒ ආයතනය වෙත අණ කරන ලද චෙක්පත් හෝ ගෙවීම් ඇණවුම් සඳහා ගෙවීම් කරන, නැතහොත් ආයතනය නොවන තැනැත්තකු වෙනුවෙන් චෙක්පත් හෝ ගෙවීම් ඇණවුම් රැස් කරන; හෝ

(ඈ) ආරක්ෂක තැන්පතු පෙට්ටි හෝ යම් වෙනත් මාදිලියක ආරක්ෂක තැන්පතු පවත්වා ගෙන යන,

යම් පහසුකමක් හෝ වැඩපිළිවෙළක් අදහස් වන අතර, ඊට ආයතනයක් සහ ඒ ආයතනයේ ගනුදෙනුකරුවන් අතර වෙනත් යම් සමාන ව්‍යාපාරික හෝ වෘත්තීමය සම්බන්ධතාවයක් ද ඇතුළත් වේ;

"බලයලත් නිලධරයා" යන්නෙන්-

(අ) (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනතේ අර්ථානුකූලව, සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට ඉහළ නිලයක පොලිස් නිලධරයෙක්; හෝ

(ආ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ පත් කරන ලද රේගු අධිකාරීවරයකුගේ නිලයට ඉහළ නිලයක රේගු නිලධරයෙක්,

අදහස් වේ;

"ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍රය" යන්නෙන්, කල්පිත ආදායකයකුට හෝ අන් තැනැත්තකුට ලියන ලද්දා වූ, නැතහොත් භාරදීමෙන් එහි හිමිකම මාරුවන වෙනත් ආකාරයකට ලියන ලද්දා වූ ද, සංචාරක චෙක්පත්, චෙක්පත්, ධාරක බැඳුම්කර, පොරොන්දු නෝට්ටු, සීමා කිරීම් රහිතව පිටසන් කරන ලද මුදල් ඇණවුම් සහ තැපැල් ඇණවුම් වැනි සම්පූර්ණයෙන් හෝ අන්‍යාකාරයෙන් ධාරක ආකෘතියකින් වූ ද මුදල් සාධන පත්‍ර අදහස් වේ;

"අර්ථලාභී අයිතිකරු" යන්නෙන්-

(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 130ඒ වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ අර්ථලාභී අයිතිකරුවකු වන ස්වාභාවික තැනැත්තකු;

(ආ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ භාරයක් හෝ ප්‍රකාශිත භාරයකට සමාන වෙනත් යම් නෛතික වැඩපිළිවෙළක් සම්බන්ධයෙන් වන විට, එම ආඥාපනතේ 19අ වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ගේ තත්ත්වයට සමාන තත්ත්වයක් දරන ස්වාභාවික තැනැත්තකු;

(ඇ) (අ) සහ (ආ) ඡේද අදාළ නොවන අවස්ථාවක, අස්ථිත්වයක හෝ භාරයක

හෝ වෙනත් නෛතික වැඩපිළිවෙළක සෘජුව ම හෝ වක්‍රව අත්‍යන්ත අයිතිය හෝ පාලනය දරන ස්වාභාවික තැනැත්තකු; හෝ

(ඇ) අස්ථිත්වයකට හෝ භාරයකට හෝ වෙනත් නෛතික වැඩපිළිවෙළකට අදාළව ගනුදෙනුවක් සිදු කරනු ලබන්නේ යම් ස්වාභාවික තැනැත්තකු වෙනුවෙන් ද, ඒ ස්වාභාවික තැනැත්තා,

අදහස් වේ;

“මුදල්” යන්නෙන්, නිකුත් කරන රට තුළ වලංගු මුදල් වශයෙන් නම් කරනු ලැබ ඇති යම් ව්‍යවහාර මුදලක් අදහස් වන අතර, ඊට ගනුදෙනු කළ හැකි ධාරක සාධන පත්‍ර ද ඇතුළත් වේ;

“නතර කිරීමේ සහ වැළැක්වීමේ නියමය” යන්නෙන්, 19 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් උල්ලංඝනය කිරීමක් හෝ පැහැර හැරීමක් හා සම්බන්ධ විශේෂ චර්යාවක් හෝ චර්යා රටාවක් තවදුරටත් කරගෙන යාමෙන් ආයතනයක් තහනම් කරනු ලබමින් මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද පරිපාලනමය දණ්ඩනයක් අදහස් වේ;

“මහ බැංකුව” යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"නිසි බලධරයා" යන්නෙන්, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම සඳහා බලය පැවරී ඇති හෝ වගකීම පැවරී ඇති යම් ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් අදහස් වන අතර, ඊට මූල්‍ය බුද්ධි ඒකකය ද ඇතුළත් වේ;

"ව්‍යවහාර මුදල්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක වලංගු මුදල් වශයෙන් නම් කරනු ලැබ ඇත්තා වූ හා නිකුත් කරන ලද රටෙහි හුවමාරු මාධ්‍යයක් වශයෙන් ව්‍යවහාරිකව භාවිත කරනු ලබන්නා වූ සහ පිළිගනු ලැබ ඇත්තා වූ ද ව්‍යවහාර මුදල අදහස් වේ;

"ගනුදෙනුකරු" යන්නට, ගනුදෙනුවක් හෝ ගිණුමක් සම්බන්ධයෙන් වන විට-

(අ) ගනුදෙනුවක් හෝ ගිණුමක් පිළිබඳ කටයුතු පිළියෙල කරනු ලැබ ඇත්තේ හෝ ගනුදෙනුවක් හෝ ගිණුමක් විවෘත කරනු ලැබ ඇත්තේ හෝ භාර ගෙන ඇත්තේ යම් තැනැත්තකුගේ නමින් ද ඒ තැනැත්තා;

(ආ) ගනුදෙනුවක හෝ ගිණුමක අත්සන්කරු;

(ඇ) ගනුදෙනුවක් පවරනු ලැබ ඇත්තේ හෝ මාරු කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා;

(ඈ) ගනුදෙනුවක් සිදු කිරීමට බලයලත් තැනැත්තෙක්; හෝ

(ඉ) ගනුදෙනුවකට හෝ ගිණුමකට අදාළව මේ පනතේ 29 වන වගන්තිය යටතේ ගනුදෙනුකරුවකු ලෙස නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තෙක්,

ඇතුළත් වේ;

“නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හෝ වෘත්තීන්” යන්නට-

(අ) 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ සූදු ක්‍රීඩා සහ ඩිජිටල් සූදු ක්‍රීඩා;

(ආ) දේපළ සංවර්ධනකරුවන් ඇතුළුව නිශ්චල දේපළ අනුයෝජිතයන්;

(ඇ) 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවී, වටිනා ලෝහ වෙළෙඳුන් සහ වටිනා හා අර්ධ වටිනා ගල් වෙළෙඳුන්;

(ඈ) පහත දැක්වෙන ක්‍රියාකාරකම් එකකට හෝ ඊට වැඩි ගණනකට අදාළව ස්වකීය සේවාදායකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සූදානම් වන

විට හෝ ගනුදෙනු සිදු කරගෙන යන විට, නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හෝ ගණකාධිකාරීවරුන් -

(i) නිශ්චල දේපළ මිලදී ගැනීම හා විකිණීම;

(ii) සේවාදායක මුදල්, සුරැකුම්පත් හෝ වෙනත් වත්කම් කළමනාකරණය කිරීම;

(iii) බැංකුවේ ඉතිරි කර ගත් මුදල් හෝ සුරැකුම්පත් ගිණුම් කළමනාකරණය කිරීම;

(iv) සමාගම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා දායක මුදල් සංවිධානය කිරීම; සහ

(v) නෛතික පුද්ගලයන් හෝ නෛතික වැඩපිළිවෙළ ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම හෝ ව්‍යාපාර අස්ථිත්ව මිලදී ගැනීම හා විකිණීම;

(ඉ) මේ අර්ථ නිරූපණයෙන් අනාාකාරයකින් ආවරණය නොවන්නා වූ ද, ව්‍යාපාරයක් වශයෙන් පහත දැක්වෙන සේවාවන් එකක් හෝ වැඩි ගණනක් තුන්වන පාර්ශ්වයන්ට සපයන්නා වූ ද, භාර සේවා හෝ සමාගම් සේවා සපයන්නන්:-

(i) නෛතික පුද්ගලයන් හෝ නෛතික වැඩපිළිවෙළ සැකසීම හෝ කළමනාකරණය කිරීම;

(ii) සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු ලෙස හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු ලෙස හෝ වෙනත් නෛතික තැනැත්තන්ට අදාළව ඒ හා සමාන තත්ත්වයකින් ක්‍රියා කිරීම, හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු වෙනුවෙන් කටයුතු පිළියෙල කිරීම;

(iii) සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් නෛතික තැනැත්තකු හෝ නෛතික වැඩපිළිවෙළක් සඳහා ලියාපදිංචි කාර්යාලයක්,

ව්‍යාපාරික ලිපිනයක් හෝ ඉඩ පහසුකම්, තැපැල් ලිපිනයක් හෝ පරිපාලන ලිපිනයක් ලබා දීම;

(iv) ප්‍රකාශිත භාරයක භාරකරුවකු ලෙස ක්‍රියා කිරීම හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු වෙනුවෙන් කටයුතු පිළියෙල කර දීම හෝ, වෙනත් යම් ආකාරයක නෛතික වැඩපිළිවෙළක් සඳහා ඊට සමාන කර්තව්‍ය ඉටු කිරීම; හෝ

(v) වෙනත් තැනැත්තකු වෙනුවෙන් නාමික කොටස්කරුවකු ලෙස ක්‍රියා කිරීම හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු වෙනුවෙන් කටයුතු පිළියෙල කර දීම;

(ඊ) අක්වෙරළ ඒකකයක් සඳහා වෙනත් යම් ලිඛිත නීතියක දී ඇති අර්ථ නිරූපණයට අනුකූලව (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේදවල, (උ) ඡේදයේ හෝ (ඌ) ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයක, වෘත්තියක හෝ ක්‍රියාකාරකමක යම් අක්වෙරළ ඒකකයක්;

(උ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු හෝ බලපත්‍ර දෙනු ලැබිය යුතු වූ (අ) ඡේදයේ සිට (ඊ) ඡේදය දක්වා වූ ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් ව්‍යාපාරයක නිරතව සිටින යම් තැනැත්තකු; සහ

(ඌ) මේ පනතේ 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාරයක්,

ඇතුළත් වේ;

"ලේඛනය" යන්නෙන්, තොරතුරු පිළිබඳ යම් වාර්තාවක් අදහස් වන අතර, ඊට-

(අ) ලිවීමක් ඇති යම් දෙයක්;

(ආ) අර්ථකථනය කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන්ට අර්ථකථනය කළ හැකි අර්ථ සහිත ලකුණු, ඉලක්කම්, සංකේත හෝ සිදුරු ඇති යම් දෙයක්;

(ඇ) වෙනත් යම් දෙයක ආධාරය ඇතිව හෝ නොමැතිව ශබ්ද, ප්‍රතිරූප හෝ ලියවිලි නිපදවිය හැකි යම් දෙයක්;

(ඈ) සිතියමක්, සැලැස්මක්, සිත්තමක්, ඡායාරූපයක් හෝ ඒ හා සමාන දෙයක්; සහ

(ඉ) විද්‍යුත් ක්‍රමයකින් තබා ගනු ලබන හෝ පවත්වාගනු ලබන ඉහත සඳහන් කවර හෝ දෙයක්,

ඇතුළත් වේ;

“මූල්‍ය බුද්ධි ඒකකවල එග්මන්ට් කණ්ඩායම” යන්නෙන්, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ ආශ්‍රිත නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම උදෙසා විශේෂඥතාවය සහ මූල්‍ය බුද්ධිය සුරක්ෂිතව හුවමාරු කිරීමට සාමාජික මූල්‍ය බුද්ධි ඒකකවලට අවස්ථාව සැලසීමට 1995 දී පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකවල ඒකාබද්ධ මණ්ඩලය අදහස් වේ;

“විද්‍යුත් ක්‍රමය” යන්නට මාධ්‍යය කවරක් වුව ද, විද්‍යුත්, චුම්භක, දෘෂ්ටික හෝ ඒ හා සමාන වෙනත් යම් ශක්තියක් මගින් උත්පාදනය කරන, යවන, ප්‍රතිග්‍රහණය කරන හෝ ගබඩා කරන තොරතුරු ඇතුළත් වේ;

“මූල්‍ය ව්‍යාපාරය” යන්නට, පහත දැක්වෙන ව්‍යාපාර හෝ කටයුතු අතුරින් යමක් ඇතුළත් වේ:-

(අ) 1988 අංක 30 දරන බැංකු පනතෙහි අර්ථ නිරූපණය කර ඇති පරිදි බැංකු ව්‍යාපාර කටයුතු;

(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි අර්ථ නිරූපණය කර ඇති පරිදි මුදල් ව්‍යාපාර කටයුතු;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම පාලනය කරනු ලබන යම් පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් පිහිටුවන ලද යම් සමිතියක් විසින් කරගෙන යනු ලබන පහත දැක්වෙන ව්‍යාපාර කටයුතු එකක් හෝ වැඩි ගණනක්; එනම්-

(i) තැන්පතු භාර ගැනීම;

(ii) මුදල් ණයට දීම;

(iii) කවර හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීම; හෝ

(iv) කවර හෝ ආකාරයකින් මුදල් ණයට දීම සහ මුදල් ආයෝජනය කිරීම;

(ඇ) 2013 අංක 1 දරන සමෘද්ධි පනත මගින් පිහිටුවන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක් විසින් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක් විසින් සිදු කරනු ලබන යම් මූල්‍ය ක්‍රියාකාරකමක්;

(ඉ) (90 වන අධිකාරය වූ) උකස් බඩු ගන්නන් පිළිබඳ ආඥාපනත යටතේ වූ උකස් බඩු ගැනීම් කටයුතු;

(ඊ) පාරිභෝගික ණය, උකස් ණය, (වගකීමක් ඇතිව හෝ නැතිව) ණය සාධ්‍යකරණය සහ වාණිජ ගනුදෙනු මූල්‍යකරණය කිරීම ඇතුළුව මුදල් ණයට දීම;

(උ) පාරිභෝගික භාණ්ඩවලට අදාළ ගනුදෙනු නොවන මූල්‍ය කල්බදුකරණය;

(ඌ) මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා;

(එ) මුදල් සහ ව්‍යවහාර මුදල් මාරු කිරීමේ සේවා;

(ඒ) ගෙවීම් කිරීමේ ක්‍රම නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම (එනම්, ණය කාඩ්පත්, හර කාඩ්පත්, සංචාරක චෙක්පත්, මුදල් ඇණවුම් සහ බැංකු අණකර සහ විද්‍යුත් මුදල්);

(ඔ) පාරිභෝගික ණය, (වගකීමක් ඇතිව හෝ නැතිව) ණය සාධ්‍යකරණය, ඇතුළුව, ඊට සීමා නොවී මූල්‍ය ඇපකර සහ මූල්‍ය බැඳීම් නිකුත් කිරීම සහ අත්පත් කර ගැනීම් ද ඇතුළත්ව වාණිජ ගනුදෙනු මූල්‍යකරණය;

(ඕ) මුදල් වෙළෙඳපල සාධන පත්‍රවල (එනම් චෙක්පත්, විනිමය බිල්පත්, තැන්පතු සහතික සහ ව්‍යුත්පන්න), විදේශ විනිමයෙහි, විනිමයෙහි, පොළී අනුපාතික සහ සුචි සාධන පත්‍රවල, අනාගත වෙළෙඳ භාණ්ඩ ව්‍යාපාරවල සහ පැවරිය හැකි සුරැකුම්පත්වල තමා වෙනුවෙන් ම හෝ ගනුදෙනුකරුවන් වෙනුවෙන් වෙළෙඳාම් කටයුතු සිදු කිරීම;

(ක) සුරැකුම්පත් නිකුතුවලට සහභාගී වීම සහ එම නිකුතුවලට අදාළ මූල්‍ය සේවා සැපයීම;

(ග) තනි හා සාමූහික ආයෝජන කළඹ කළමනාකරණය;

(ච) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදල් ආයෝජනය කිරීම, පරිපාලනය කිරීම හෝ කළමනාකරණය කිරීම;

(ජ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් මුදල් හෝ ද්‍රවශීල සුරැකුම්පත් ආරක්ෂිතව තැබීම සහ පරිපාලනය කිරීම;

(ට) ආරක්ෂිත භාරකාර සේවා;

(ඩ) ප්‍රාරක්ෂණය සහ ජීවිත රක්ෂණය සහ වෙනත්

ආයෝජන ආශ්‍රිත රක්ෂණය ස්ථානගත කිරීම මෙන්ම නියෝජිතයන් සහ තැරැව්කරුවන් මගින් රක්ෂණ අතරමැදිකරණය සිදු කිරීම;

(ණ) විශ්‍රාම පාරිතෝෂික යෝජනා ක්‍රමයක භාරකාරත්ව පරිපාලනය හෝ ආයෝජන කළමනාකරණය කිරීම;

(ත) 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව වෙළෙඳපොළ අතරමැදියකුගේ යම් ක්‍රියාකාරකමක්;

(ද) (417 වන අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ පවත්වාගෙන යනු ලබන යම් මූල්‍ය ක්‍රියාකාරකමක්;

(න) තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, අතථ්‍ය වත්කම් සේවා සැපයීම;

(ප) අක්වෙරළ ඒකකයක් සඳහා වෙනත් යම් ලිඛිත නීතියක දී ඇති අර්ථ නිරූපණයට අනුකූලව (අ) ඡේදයේ සිට (න) ඡේදය දක්වා වූ ඡේදවල, (ඛ) ඡේදයේ හෝ (ම) ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයක හෝ

ක්‍රියාකාරකමක යම් අක්වෙරළ ඒකකයක්;

(ඞ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු හෝ බලපත්‍ර දෙනු ලැබිය යුතු (අ) ඡේදයේ සිට (ප) ඡේදය දක්වා වූ ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් ව්‍යාපාරයක යෙදී සිටින යම් තැනැත්තකු; සහ

(ම) මේ පනතේ 29 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යාපාරයක්;

“මූල්‍ය කාර්ය සාධක බලකාය” යන්නෙන්, මුදල් විශුද්ධිකරණයට, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමට එරෙහිව ගෝලීය මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා වූ ප්‍රතිපත්ති සංවර්ධනය කරනු ලබන සහ ප්‍රවර්ධනය කරනු ලබන 1989 වර්ෂයේ දී පිහිටුවන ලද අන්තර් රාජ්‍ය ආයතනය අදහස් වේ;

“මූල්‍ය බුද්ධිය” යන්නෙන්, මූල්‍ය බුද්ධි ඒකකයෙහි සන්දර්භය තුළ, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම හෝ සමූල ඝාතක අවි සංගණනය සඳහා මුදල් සැපයීම හා සම්බන්ධ යම් ක්‍රියාවකට හෝ යම් නීතිවිරෝධී ක්‍රියාකාරකමකට අදාළව,

දැනට පවතින සහ ලබාගත හැකි තොරතුරු මත පදනම් වූ මෙහෙයුම් හා උපායමාර්ගික විශ්ලේෂණයේ ප්‍රතිඵලය අදහස් වේ;

“විදේශීය රට” හෝ “විදේශීය රාජ්‍යය” යන්නට, විදේශීය රටක හෝ විදේශීය රාජ්‍යයක විජිතයක්, දේශ භූමියක්, ආරක්ෂිත දේශයක් හෝ වෙනත් උපජීවී රටක් හෝ ඒ විදේශීය රටෙහි හෝ විදේශීය රාජ්‍යයෙහි ලියාපදිංචි නැවක් හෝ ගුවන් යානයක් ඇතුළත් වන අතර, මහජන චීන සමූහාණ්ඩුවේ හොංකොං විශේෂ පරිපාලන කලාපය ද ඊට ඇතුළත් වන සේ සැලකිය යුතු ය;

“ආණ්ඩුවේ ආයතනය හෝ නියෝජ්‍යායතනය” යන්නට, ආණ්ඩුවේ අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක්, පළාත් සභාවක්, යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව වෙත පවරනු ලැබ ඇති යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ වෙනත් ව්‍යාපාරයක් සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති හෝ ලියාපදිංචි කර ඇති ලෙසට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහකට වඩා වැඩි ප්‍රතිශතයක් ආණ්ඩුව විසින් හෝ යම් රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගමක් ඇතුළත් වේ;

“ආයතනය” යන්නෙන්, මේ පනතේ අර්ථානුකූලව, යම් මූල්‍ය ව්‍යාපාරයක හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක හෝ වෘත්තියක නිරතව සිටින හෝ, යම්

මූල්‍ය ව්‍යාපාරයක් හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක් කරගෙන යන යම් තැනැත්තකු අදහස් වේ;

“නීතිය බලාත්මක කිරීමේ නියෝජ්‍යායතනය” යන්නෙන්, යම් ලිඛිත නීතියක් යටතේ යම් වරදක් විමර්ශනය කිරීම සඳහා හෝ එම වරද සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා බලතල පවරනු ලැබ ඇති යම් දෙපාර්තමේන්තුවක්, අධිකාරියක් හෝ අස්ථිත්වයක් අදහස් වන අතර, ඊට වරදක් සිදු කිරීම විමර්ශනය කිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ බලය දෙනු ලැබ ඇති වෙනත් යම් තැනැත්තකු ද ඇතුළත් වේ;

“බලපත්‍ර ලබා දීමේ අධිකාරිය” යන්නෙන්, අදාළ ව්‍යාපාරය හෝ ක්‍රියාකාරකම කරගෙන යාම සඳහා ආයතනවලට බලපත්‍ර ලබා දීමේ බලතල සහිතව, යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද යම් අධිකාරියක් අදහස් වේ;

“පළාත් පාලන ආයතනය” යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඊට ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇතිකොට පිහිටුවන ලද යම් අධිකාරියක් ද ඇතුළත් වේ;

“අමාත්‍යවරයා” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45

වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පිළිබඳ විෂයය සහ ඊට අදාළ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

“මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා” යන්නෙන්, යම් සන්නිවේදනයක් හෝ පණිවුඩයක් මාර්ගයෙන් හෝ එම සේවා සපයන්නා අයත් වන නිෂ්කාශන ජාලයක් හරහා පැවරීමක් මාර්ගයෙන්-

(අ) මුදල් හෝ මුදල් වටිනාකම් හුවමාරු කිරීම;

(ආ) වෙනත් තැනැත්තන් වෙනුවෙන් අරමුදල් හෝ මුදල් වටිනාකම් රැස්කිරීම, දැරීම, හුවමාරු කිරීම හෝ ප්‍රේෂණය කිරීම හෝ අන්‍යාකරයකින් අරමුදල් හෝ මුදල් වටිනාකම් පැවරීම් සම්බන්ධයෙන් ගනුදෙනු කිරීම;

(ඇ) අරමුදල් බෙදාහැරීම; හෝ

(ඈ) සංචාරක චෙක්පත්, මුදල් ඇණවුම් හෝ සමාන සාධන පත්‍ර නිකුත් කිරීම, විකිණීම හෝ නිදහස් කිරීම,

අදහස් වේ;

“සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරද” යන්නෙන්, සමූල ඝාතක අවි සංගුණනය සහ ඒ වෙනුවෙන් මුදල් සැපයීම සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා

සම්මතය බලාත්මක කරමින් 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක නිශ්චිතව දක්වා ඇති හෝ සමූල ඝාතක අවි සංගුණනය සහ ඒ වෙනුවෙන් මුදල් සැපයීම සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති හෝ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මතයන් බලාත්මක කරන වෙනත් යම් ලිඛිත නීතියක නිශ්චිතව දක්වා ඇති යම් වරදක් අදහස් වේ;

“මුදල් විශුද්ධිකරණය වරද” යන්නෙන්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ වරදක් අදහස් වේ;

“ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ වරද” යන්නෙන්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවත්වීමේ සම්මුති පනතේ 3 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ වරදක් අදහස් වේ;

“මෙහෙයුම් විශ්ලේෂණ” යන්නෙන්, යම් නිශ්චිත ක්‍රියාකාරකම් හෝ ගනුදෙනු පිළිබඳ හෝඩුවාවන් පසුපස යාම පිණිස, (තැනැත්තන්, වත්කම්, අපරාධ ජාල සහ සංගම් වැනි) නිශ්චිත ඉලක්ක හඳුනා ගැනීම සඳහා සහ එම ඉලක්ක සහ අපරාධවලින් උත්පාදිත සසම්භාවී දේ, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම හෝ නීති විරෝධී ක්‍රියාකාරකම් අතර පවතින සම්බන්ධතා නිශ්චය කිරීම සඳහා දැනට පවතින සහ ලබාගත හැකි තොරතුරු භාවිත කිරීම අදහස් වේ;

“තැනැත්තා” යන්නෙන්, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් ද නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති නෛතික වැඩපිළිවෙළක් ද එම තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ශාඛාවක් ද ඇතුළත් වේ;

“නියම කරනු ලබන” යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබීම අදහස් වේ;

“දේපළ” යන්නෙන්, ද්‍රව්‍යමය හෝ අද්‍රව්‍යමය වුව ද, චංචල හෝ නිශ්චල වුව ද, ස්පර්ශනීය හෝ අස්පර්ශනීය වුව ද හෝ අතථ්‍ය වුව ද සෑම වර්ගයක ම වත්කම් අදහස් වන අතර, ඊට එම වත්කම්වලට ඇති හිමිකම හෝ එම වත්කම් කෙරෙහි ඇති සම්බන්ධතාව පිළිබඳ සාක්ෂි වන්නා වූ නෛතික ලේඛන හෝ සාධනපත්‍ර ද ඇතුළත් වේ;

“පළාත් සභාව” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද යම් පළාත් සභාවක් අදහස් වේ;

“රාජ්‍ය සංස්ථාව” යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත හැර, යම් ලිඛිත නීතියක් මගින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක්, ණයක් හෝ අන්‍යාකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් සපයනු ලබන්නා වූ ද යම් සංස්ථාවක්,

මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

“සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද සහ ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ;

“වාර්තාව” යන්නෙන්, දත්ත සටහන් කර හෝ ලකුණු කර ඇත්තා වූ ද, යම් තැනැත්තකුට, පරිගණක පද්ධතියකට හෝ වෙනත්

උපාංගයකට කියවීමට හෝ අවබෝධ කර ගැනීමට හැකියාව ඇත්තා වූ ද යම් ද්‍රව්‍යයක් අදහස් වේ;

“ලියාපදිංචි කිරීමේ අධිකාරිය” යන්නෙන්, අදාළ ව්‍යාපාරය හෝ ක්‍රියාකාරකම කරගෙන යාමට ආයතන ලියාපදිංචි කිරීමේ බලතල සහිතව යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද අධිකාරියක් අදහස් වේ;

“නියාමන අධිකාරිය” යන්නෙන්, ආයතන නියාමනය කිරීමේ හෝ ආයතනවලට අදාළව ප්‍රමිතීන් සහ පාලනයන් සම්බන්ධයෙන් බලය දීමේ සහ ඒ ප්‍රමිති සහ පාලන බලාත්මක කිරීමේ බලතල සහිතව යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද අධිකාරියක් අදහස් වේ;

“ස්වයං නියාමන අධිකාරිය” යන්නෙන්, යම් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් හෝ වෘත්තියක් තුළ (නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හෝ ගණකාධිකාරීවරුන් වැනි) ස්වකීය සාමාජිකයන් නියාමනය කරන, අධීක්ෂණය කරන, පාලනය කරන සහ සුපරීක්ෂණය කරන අධිකාරියක් අදහස් වේ;

“නම් කරන ලද පුද්ගලයකු හෝ නම් කරන ලද අස්ථිත්වයක්” යන්නෙන්-

(අ) ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් ප්‍රකාරව වූ වරදක් හා සම්බන්ධ බවට දැන දැනම යම් ක්‍රියාවක්-

(i) සිදු කර ඇති;

(ii) සිදු කිරීමට තැත් කර ඇති;

(iii) සිදු කිරීමේ දී සහභාගී වී ඇති; හෝ

(iv) සිදු කිරීමට පහසුකම් සලසා ඇති,

පුද්ගලයකු හෝ අස්ථිත්වයක්; හෝ

(ආ) 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත යටතේ සාදන ලද නියෝග ප්‍රකාරව විදේශ කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් නියම කරන ලද පුද්ගලයකු හෝ අස්ථිත්වයක්,

අදහස් වේ;

"උපායමාර්ගික විශ්ලේෂණය" යන්නෙන්, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම ආශ්‍රිත ප්‍රවණතා සහ රටාවන් හඳුනා ගැනීමට

වෙනත් නිසි බලධරයන් විසින් සපයනු ලැබිය හැකි දත්ත ද ඇතුළත්ව, දැනට පවත්නා සහ ලබාගත හැකි තොරතුරු භාවිත කිරීම අදහස් වේ;

"අධීක්ෂණ අධිකාරිය" යන්නෙන්, ආයතන අදාළ ලිඛිත නීතිවලට අනුකූලව කටයුතු කිරීම අධීක්ෂණය කිරීම හෝ බලාත්මක කිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද යම් අධිකාරියක් අදහස් වන නමුත්, 14අ වන වගන්තිය යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය ඊට ඇතුළත් නොවේ;

"සැක කටයුතු ගනුදෙනු වාර්තාව" යන්නෙන්, මේ පනතේ 7 වන වගන්තිය යටතේ ඉදිරිපත් කිරීමට නියමිත වාර්තාව අදහස් වේ;

"ත්‍රස්තවාදී ක්‍රියාව" යන්නට, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ගනුදෙනුව" යන්නෙන්, යම් මූල්‍ය ව්‍යාපාරයකට හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයකට හෝ වෘත්තියකට සම්බන්ධ යම් දේශීය හෝ ජාත්‍යන්තර ක්‍රියාකාරකමක් අදහස් වේ;

"දේපළ පිළිබඳ ගනුදෙනුව" යන්නට-

(අ) මිළදී ගැනීමක්, විකිණීමක්, ණයක්, අය කිරීමක්, උකසක්, කැප අයිතියක්, ඔඩපනයක්, පැවරීමක්, භාරදීමක්, භාර

කිරීමක්, ප්‍රතිනිවේශනයක්, ප්‍රේෂණයක්, ත්‍යාගයක්, පරිත්‍යාගයක්, භාරයක් ඇති කිරීමක්, නිරවුල් කිරීමක්, යම් භාණ්ඩයක් තැන්පත් කිරීම ද ඇතුළුව තැන්පතුවක්, ආපසු ගැනීමක්, වත්කම් අතර පැවරීමක් සහ ණයවර දීර්ඝ කිරීමක් ද;

(ආ) යම් අනුයෝජිතත්වයක් හෝ ඇටෝර්නි බලය පැවරීමක් ද; සහ

(ඇ) ඒ සමස්ත දේපළ කෙරෙහි හෝ ඉන් යම් කොටසක් කෙරෙහි යම් වර්තමාන හෝ අනාගත වුව ද, පැවරුණු හෝ සම්භාවී වුව ද, යම් අයිතිවාසිකමක්, හිමිකමක්, සම්බන්ධතාවක් හෝ වරප්‍රසාදයක් යම් තැනැත්තකුට පිරිනැමීමේ ප්‍රතිඵලය ඇති කරන, කවර ආකාරයකින් වූ හෝ කවර විස්තරයකට නැතහොත් කවර ස්වභාවයකට අයත් වූ හෝ කවර ආකාරයකින් විස්තර කරනු ලබන්නා වූ වෙනත් යම් නීයාදනයක් හෝ ගනුදෙනු කිරීමක් ද,

ඇතුළත් වේ;

“නීති විරෝධී ක්‍රියාකාරකම” යන්නට, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අතථ්‍ය වත්කම" යන්නෙන්, ඩිජිටල් ආකාරයෙන් වෙළෙඳාම් කළ හැකි හෝ පවරනු ලැබිය හැකි වූ ද, ගෙවීම් හෝ ආයෝජන කාර්ය සඳහා භාවිත කළ හැකි වූ ද, වටිනාකම් පිළිබඳ ඩිජිටල් නිරූපණයක් අදහස් වන නමුත්, ඊට අධිකාරී මුදල්, සුරැකුම්පත් සහ වෙනත් මූල්‍ය වත්කම් පිළිබඳ යම් ඩිජිටල් නිරූපණයක් ඇතුළත් නොවේ; සහ

"අතථ්‍ය වත්කම් සේවා සපයන්නා" යන්නෙන්, වෙනත් තැනැත්තකු සඳහා හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් පහත දැක්වෙන ක්‍රියාකාරකම් හෝ මෙහෙයුම් එකක් හෝ වැඩි ගණනක් සපයන, පරිපාලනය කරන, කළමනාකරණය කරන හෝ හසුරුවන යම් තැනැත්තකු අදහස් වේ:-

(අ) අතථ්‍ය වත්කම් සහ අධිකාරී මුදල් හුවමාරු කිරීම;

(ආ) අතථ්‍ය වත්කම් ස්වරූප එකක් හෝ වැඩි ගණනක් හුවමාරු කිරීම;

(ඇ) අතථ්‍ය වත්කම් පැවරීම;

(ඈ) අතථ්‍ය වත්කම් පාලනය කිරීමට හැකි කරවමින් අතථ්‍ය වත්කම් හෝ සාධනපත්‍ර සුරක්ෂිතව තබා ගැනීම හෝ පරිපාලනය කිරීම; සහ

(ඉ) අතථ්‍ය වත්කමක් නිකුත් කරන්නකුගේ අර්පණයකට

හෝ විකිණීමකට අදාළ මූල්‍ය සේවාවලට සහභාගී වීම සහ එම සේවා සැපයීම.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**40.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.